The Journal of Archaeology and Heritage Studies (JAHS) 2024: 11 (I) 1-25 pp

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# අනුරාධපුර විහාරපාලුගම ජීවත් වන වෙල්ලිදුර වංශික පරපුරෙහි අතීත සහ වර්තමාන සමාජ පසුබිම පිළිබඳ තුලණාත්මක අධ්‍යයනයක්

දිලාන් ගුණවර්ධන[1] සහ ඉරේෂා සෙව්වන්දි වාසල[2]

[1]මහාචාර්ය, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. gunawardaned@gmail.com

[2]සමාජ විද්‍යා උපාධි අපේක්ෂිකා, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

## සංක්ෂිප්තය

ශ්‍රී මහා බෝධීන් වහන්සේ භාරව කටයුතු කරමින් විහාර ගම්වල ජීවත් වන වෙල්ලිදුර වංශිකයන්ගේ අතීත සමාජ තත්වයන් සහ ඔවුන්ගේ කාර්යභාරයන් වර්තමානය වන විට කෙබඳු ස්වරූපයක් ගෙන තිබේ ද යන්න සම්බන්ධයෙන් තුලනාත්මක විග්‍රහයක් මෙම පර්යේෂණයෙන් සිදු කෙරේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී අනුරාධපුර ශ්‍රී මහා බෝධිය භාර විහාර ගම්වල ජීවත්වන ප්‍රජාවගේ වර්තමාන සමාජ, ආර්ථිකය, අධ්‍යාපනික යන අංශ පිළිබඳව අධ්‍යයනය කරයි. ඔවුන් විසින් ශ්‍රී මහා බෝධියට සිදු කරන තේවාවන් පිළිබඳව අධ්‍යයනය කිරීම, ඔවුන්ගේ අතීත සමාජ තත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම, ඔවුන් වර්තමානයේ මුහුණ දෙන ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීම, ඔවුන්ගේ සංස්කෘතික වෙනස්වීම්වලට බලපෑ හේතු මතුකර පෙන්වීම මෙහි පරමාර්ථ වශයෙන් ගෙන තිබේ. මෙම අධ්‍යයනයේ දී වෙල්ලිදුර වංශිකයන්ගේ සමාජ සහ සංස්කෘතික ස්වභාවය අධ්‍යයනය කිරීමට මානව ප්‍රජා විධි ක්‍රමවේදය (Ethnomethodology) යොදා ගත් අතර, පර්යේෂණ විධික්‍රම වශයෙන් තුලනාත්මක ක්‍රමය, ඓතිහාසික සිද්ධි අධ්‍යයන ක්‍රම යොදා ගනු ලැබීය. දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතීයික දත්ත ද රැස් කරනු ලැබීය. එසේ ප්‍රාථමික දත්ත රැස් කිරීමේ දී ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා යන ක්‍රම ද, ද්විතීයික දත්ත විමර්ශනයේ දී ප්‍රකාශිත වාර්තා, මුද්‍රිත ලේඛන හා වෙබ්පිටුගත කරුණු භාවිතයට ගැණින. එක් රැස් කරගනු ලැබූ ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමයට බඳුන් කරන ලදි. ඒ අනුව වෙල්ලිදුර වංශිකයන් යනු ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම කරවීමේ දී එහි ආරක්ෂාව සඳහා පැමිණි කුමාරවරුන් අට දෙනා අතරින් ප්‍රධානියා වූ බෝධිගුප්ත කුමාරයාගෙන් පැවත එන පිරිසකි. මෙරට ශ්‍රී මහා බෝධිය රෝපණය කළ දිනයේ පටන් අද දක්වාම එහි ආරක්ෂාව, පුද පූජා, තේවාවන් ආදී බහුවිධ රාජකාරි සඳහා දායකත්වය සපයන්නේ මෙම වෙල්ලිදුර වංශිකයන්ය. එවැනි කාර්යයන් හමුවේ කැපකිරීම් රාශියක් ඔවුන් විසින් සිදු කරයි. කෙසේ වර්තමාන සමාජ වෙනස්වීම් තුළ මෙම වෙල්ලිදුර වංශිකයන්ගේ සමාජ තත්වයෙහි වෙනස්කම් රාශියක් සිදුව ඇති බව දක්නට ලැබෙයි. කෙසේ වුව ද මෙවන් සමාජ විපර්යාසයන් හමුවේ පරම්පරාගත වගකීමක් ලෙස ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙනුවෙන් සියවස් විසි තුනක් පුරාවටම රාජකාරි හා තේවාවන් සිදු කරන්නේ වෙල්ලිදුර වංශිකයන් බව සඳහන් කළ හැකිය.

*මුඛ්‍ය පද- ශ්‍රී මහා බෝධීන් වහන්සේ, විහාර ගම්, වෙල්ලිදුර වංශිකයන්, සමාජ වෙනස්වීම*

ARTICLE INFO

***Article history:***
Article Received: 22 April 2024
Revision Received: 10 January 2025
Accepted: 20 March 2025
Available online: 03 June 2025



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk*

## 1. හැඳින්වීම

අනුරාධපුර ඓතිහාසික නගරයේ පිහිටි පූජනීය ස්ථාන අතරින් බෞද්ධයන්ගේ වන්දනාවට පත් වූ ප්‍රධානම ස්ථානය ශ්‍රී මහා බෝධියයි. මෙම ශ්‍රී මහා බෝධිය බුදුන් වහන්සේ බුද්ධත්වයට පැමිණීමේ දී පිට දුන් ඉන්දියාවේ බුද්ධගයාවේ තිබූ මහ බෝධියේ දකුණු ශාඛාවකි (තෙන්නකෝන්, ආර්, 1964: 250-251). ක්‍රි.පූ. 3 වන සියවසෙහි මෙම බෝධිය ලක්දිව යාපා පටුනෙහි සංඝමිත්තා තොටුපොල ලෙස දැනට හඳුන්වන තොටුපලට ගෙන එන ලද්දේ අශෝක අධිරාජයාගේ දියණිය වන සංඝමිත්තා මෙහෙණිය විසිනි (සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ, 1996: 19 පරි, 1-6 ගාථා). ක්‍රි.පූ. 288 දී දේවානම්පියතිස්ස රජතුමා විසින් අනුරාධපුර මහමෙව්නා උයනෙහි මෙම ශ්‍රී මහා බෝධිය රෝපණය කරන ලදි. එය පූජනීය ඇසතු වෘක්ෂයකි. එය මේ දක්වා ලෝකයේ තිබෙන මිනිස් අතකින් රෝපණය කළ හා එසේ රෝපණය කළ කාල වකවානුව දන්නා පැරණිම වෘක්ෂය ලෙස මෙම බෝධීන් වහන්සේ වාර්තාගත වෙයි.

"මහබොධි'ඤ්ච ථෙරි'ඤ්ච ආණපෙතුං මහීපතී

ඵථෙරෙන වුත්තවචනං සරමානො සකෙ සරෙ"

යන ගාථාවෙන් පටන්ගෙන මහාවංශයේ ගාථා 68කින් ශ්‍රී මහා බෝධිය වැඩමවීම පිළිබඳව 18 වන පරිච්ඡේදයේ සඳහන් වේ (සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ, 1996: 19 පරි, 1-6 ගාථා). මහින්දාගමනය හෙවත් මිහිඳු මහරහතන් වහන්සේ බුදු දහම රැගෙන ලංකාවට වැඩමවීමෙන් අනතුරුව එවකට ලංකාවේ පාලකයා වූ දේවානම්පියතිස්ස රජතුමා බුදු දහම වැළඳගනිමින් අනුරාධපුර මහමෙව්නා උයන පූජා කරන ලදි. එම අවස්ථාවේ දී අනුලා දේවිය ප්‍රධාන පිරිසක් පැවිදි වීමට අවසර පැතුහ. මිහිඳු හිමියන්ට එය සිදු කිරීමට අවසරය (ආගමික වශයෙන් වූ අවසරය) නොවූ හෙයින් සංඝමිත්තා තෙරණිය ලංකාවට වැඩමවන ලෙසට හසුන්පතක් අශෝක රජු වෙත මිහිඳු හිමියන්ගේ අවසරයෙන් තිස්ස රජු විසින් යවන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහ බෝධීන් වහන්සේත් රැගෙන ලංකාවට වැඩම කළාය (නානායක්කාර 1998, 02).

සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහ බෝධිය වැඩමවීමෙන් අනතුරුව බෝධි පැළැටිය උත්සවශ්‍රීයෙන් දේවානම්පියතිස්ස රජු විසින් රෝපණය කරවන ලද බව වංසකතාව පෙන්වා දෙයි. ඒ මිහිඳු හිමි, සංඝමිත්තා තෙරණිය ඉදිරිපිට දී කාජරගාම හා ඡන්දනගාම වැනි දුර බැහැර ප්‍රදේශවලින් පැමිණි ප්‍රභූන්ගෙන් හා වෙනත් ප්‍රධානීන්ගේ සහය ඇතිවය. ඒ බෝධියෙන් වෙන්කර ගන්නා ලද තවත් පැළ අටක් (08) ලංකාවේ ජම්බුකෝල, තිවක්ක, ථූපාරාම, තිස්සමහාරාම, ප්‍රථමසේටිය, චෛතියගිරි, කජරාගාම සහ චන්දනාගාම යන ප්‍රදේශවල පූජනීය වෘක්ෂ ලෙස රෝපණය කරන ලද බව පැවසේ (සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ, 1996: 19 පරි, 1-6 ගාථා).

සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ශ්‍රී මහ බෝධිය වැඩමවීමත් සමඟ මෙරටට තවත් 18 කුලයක පිරිසක් පැමිණියහ. මෙම පිරිසේ ප්‍රධානීන් ලෙස පැමිණි කුමාරවරු අට දෙනෙකුට ශ්‍රී මහ බෝධියට උපස්ථාන කිරීම භාර ගත්හ.

- බෝධිගුප්ත කුමාරයා - මහා බෝධිය රැකීම (ලක්දිව ජයමහා ලේනා තනතුර)
- සුමිත්ත කුමාරයා - කුල වැස්සන් සමග මහා බෝධියට පෙරහැර කිරීම (ජයමහලේනා තනතුර)
- චන්ද්‍රගුප්ත කුමාරයා - මහ බෝ මගුලෙහි රන්බෙර වැයීම (මලය රජ තනතුර)
- දේවගුත්ත කුමාරයා - පිරිත් පැන් ගෙන නුවර පැදකුණු කිරීම (ලක්මහ රැකිනා තනතුර)
- ධර්මගුත්ත කුමාරයා - සක් පිඹීම (මෝරිය සිටු තනතුර)


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

- සූරියගුත්ත කුමාරයා - මහා බෝධියට රන් කෙණ්ඩියෙන් පිරිත් පැන් ඉසීම (කොතුරුගානා තනතුර)
- ගෝතම කුමාරයා - බෝධීන් වහන්සේට ඉහළින් ධවල ඡත්‍ර දැමීම (සත්ගන්නා තනතුර)
- ජුතින්දර කුමාරයා - ආරක්ෂක කටයුතු (අරක්මේනා තනතුර)

(සේනාධීර සහ ගුණපාල, 1970 : 98)

මෙලෙස පැමිණි බෝධිහාර කුලවල ජනතාව අදටත් අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේට තම රාජකාරී ඉටු කරමින් ඒ අවට ගම්වල වාසය කරති.

එදා පටන් අද දක්වාම තමන්ට පැවරුණ ශ්‍රී මහා බෝධිය රැකගැනීමේ හා වත්පිළිවෙත් සිදු කිරීමේ රාජකාරිය භාරව සිටින එවැනි ගම් 09ක් තිබේ. ශ්‍රී ලංකාවේ උතුරු මධ්‍යම පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ බටහිර අනුරාධපුර මැතිවරණ කොට්ඨාසයට අයත් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති මෙම ගම්මාන හැඳින්වීමට යෙදෙන නාමයට පෙර "විහාර" යන විශේෂණ පදයක් යෙදේ. එම ගම්මාන නවය පහත පරිදි වේ.

- විහාර පාලුගම
- විහාර හල්මිල්ලකුලම
- විහාර මැදවච්චිය
- විහාර කල්ලංචිය
- විහාර බුලංකුලම
- විහාර තිරප්පනේ
- විහාර පුසියංකුලම
- විහාර ඉලුප්පුකුලම
- විහාර කැප්පෙටියාව

මෙම ගම්වල ආදි පදිංචිකරුවන් වන වෙල්ලිදුර කුල වංශිකයන් අනුරාධපුර පූජා නගරයේ පිහිටුවා ඇති ශ්‍රී මහා බෝධීන්වහන්සේගේ ප්‍රථම භාරකරුගේ පරපුරේ වර්තමාන පිරිවරයි. දීර්ඝ කාලයක පටන් දක්ෂිණ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ තේවාවන් සියල්ලෙහිම භාරකරුවන් වන්නේ ද මොවුන්මය (චන්ද්‍රසේකර, 2022: 111).

### 1.1. අධ්‍යයනයේ අරමුණු

ශ්‍රී මහා බෝධිය භාරව සිටින විහාර ගම්වල ජීවත්වන ජනතාව ශ්‍රී මහා බෝධිය රැකබලා ගැනීමටත් එයට තේවාවන් පැවැත්වීමටත් කැපකිරීම් රාශියක් සිදු කරයි. එදා පටන් අද දක්වා ඔවුන් ඔවුන්ට පැවරුණ රාජකාරිය ඉටු කිරීමේ දී සමාජ වෙනස්වීම්වලට මුහුණ දීමට සිදු වුවත් එම කාර්යය නොකඩවා සිදු කරයි. ශ්‍රී මහා බෝධිය භාරව සිටින විහාර ගම්වල වර්තමාන සමාජ තත්ත්වය අධ්‍යයනය කිරීම එනම් ඔවුන්ගේ වර්තමාන ජීවිතවල සමාජ පසුබිම, ආර්ථිකය, අධ්‍යාපනය යන අංශයන් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය.

මීට අමතරව මෙම ගම්වල ජීවත්වන පිරිස ශ්‍රී මහා බෝධියට සිදු කරනු ලබන තේවාවන්, ඔවුන්ගේ අතීත සමාජ තත්වය, ඔවුනට මුහුණ දීමට සිදුව ඇති ගැටලු, හා ඔවුන්ගේ සමාජ තත්ත්වයෙහි වෙනස්වීම් සහ එයට බලපෑ හේතු අධ්‍යයනය කිරීම ආදී උප අරමුණු සාක්ෂාත්කර ගැනීමට ද බලාපොරොත්තු විය.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් ආශ්‍රයෙන් සිදු කල මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් මානව ප්‍රජා විධි ක්‍රමවේදය (Ethnomethodology) ද, පර්යේෂණ විධික්‍රම ලෙස ඓතිහාසික ක්‍රමය (Historical Method) සහ තුලනාත්මක ක්‍රමය (Comparative Method) මූලික වශයෙන් යොදාගෙන ඇත (උයන්ගොඩ, 2010: 2-14). ඓතිහාසික ක්‍රමය යොදාගැනීම තුළින් ගමේ ඓතිහාසික පසුබිම සහ ගමේ ක්‍රමික විකාශනය සොයා බැලීමට හැකියාව ලැබේ. තුලනාත්මක ක්‍රමය යනු "විවිධ සමාජ සහ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කණ්ඩායම් අතර ඇති සමානකම් සහ අසමානකම් තුලනය කර බැලීමක් " (Rao 1990, 45) ලෙස සරලව හැඳින්විය හැකිය. මෙම අධ්‍යයන ක්‍රම දෙකම මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්‍රම වශයෙන් යොදාගෙන ඇත.

දත්ත රැස්කිරීමේ කාර්යයේ දී ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම හා ද්විතික දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම යන ක්‍රම දෙකම වෙත මූලික අවධානය යොමු කරනු ලැබීය. ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම අතරින්ක්ෂේත්‍ර නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා ක්‍රමය ප්‍රධාන වශයෙන් යොදාගත් අතර, සම්මුඛ සාකච්ඡා ක්‍රමය යටතේ දත්ත රැස් කිරීමේදී තෝරාගත් පුද්ගලයින්, තෝරා ගත් පුද්ගල කණ්ඩායම් හා තෝරා ගත් ආයතන මගින් දත්ත ලබා ගනු ලැබීය. විශේෂයෙන් ස්වාමීන් වහන්සේලා, ශ්‍රී මහ බෝධිය අසල තේවාවන් සිදු කරන කපු මහත්වරුන්, විහාරගම්වල වැඩිහිටියන් වැනි පිරිසගෙන් අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය යෝග්‍ය විය. ද්විතික දත්ත භාවිතයේ දී රාජ්‍ය ආයතනගත වාර්තා විශේෂයෙන් සම්පත් පැතිකඩ මෙන්ම, මුද්‍රිත ලේඛන, වෙබ්පිටුවල අන්තර්ගතයන් උපයෝගී කර ගැනීම වැනි ක්‍රම භාවිත කර ඇත. මෙම දත්ත මගින් ගමේ සංයුතිය, අධ්‍යාපනය, සෞඛ්‍ය, ආර්ථිකය, පොදු පහසුකම් වැනි සමාජ තත්වයන් හඳුනා ගැනීමට හැකියාව ලැබුණි.

දත්ත විශ්ලේෂණයේ දී ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා තේමා විශ්ලේෂණ ක්‍රමය වෙත මූලික අවධානය යොමු කරනු ලැබීය. ඒ අනුව ඉහත ශිල්ප ක්‍රම ඔස්සේ රැස් කරගනු ලැබූ ගුණාත්මක දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමය සහ න්‍යාය පාදක විශ්ලේෂණ ක්‍රමය වැනි විශ්ලේෂණ ක්‍රමයන්ට භාජනය කරමින් ගැටළුව හා සම්බන්ධ නිගමන වෙත එළැඹුණි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී මහ බෝධියේ ආරක්ෂාව වෙනුවෙන් බෝධිගුප්ත කුමාරයාගෙන් තනතුරු ලැබූ කුල පිරිස් අතර වෙල්ලිදුර වංශිකයන් නම් පිරිසක් විය. මුල් කාලීනව ශ්‍රී මහ බෝධිය අවට ජීවත් වූ මෙම පිරිස පසුකාලීනව ගම්වර ලබමින් ශ්‍රී මහ බෝධියට නුදුරු ගම් නවයක (ඉහත පෙන්වා දුන් පරිදි) පදිංචි වී ඇත. මින් පෙර විහාර පාලුගම විහාර පාලගම ලෙස හඳුන්වා ඇත. එමෙන්ම විහාර පුසියංකුලම හා විහාර ඉලුප්පුකුලම යන ග්‍රාම නාම දෙකෙන් විහාර යන්න ඉවත්ව තිබේ (සිරිනිවාස හිමි 2007, 25).

මෙම වෙල්ලිදුර වංශිකයන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ තේවා කටයුතු සඳහා සහාය වෙයි. සියලු තේවාවන් ඇතුළු පාලන ආරක්ෂක රාජකාරී සඳහා "මහයා" හෙවත් "මහදුරයා" නම් වූ කණ්ඩායම් නායකයෙකු වේ. ඊට අමතරව ගම් නවය සඳහා ප්‍රධාණීන් නව දෙනෙකු "ගම්දුරයන්" ලෙස රාජකාරි සිදුකරයි. ඊටත් අමතරව "වැසියන්" "වැසි කපුමහතුන්" ලෙස තම රාජකාරී සියල්ල සිදුකරයි. වර්තමානයේ දී මොවුන් සැම දෙනා " කපු මහතුන්" ලෙස ද හඳුන්වයි. එනමුත් අතීතයේ දී සැදැහැවතුන්ට සෙත් පතා යාතිකා කිරීම මොවුන්ට අයත් රාජකාරියක් නොවුනි. අතීතයේ දී වැසි, ගම්දුර හා මහදුර ආදී තනතුරු සියල්ල පත් කරන ලද්දේ විහාර ගම්වාසී පමණක් වූ වෙල්ලිදුර වංශික පමණක් වූ ගම් වැසියන්ගේ ඡන්ද විමසීමක් මගිනි. මහයා ප්‍රමුඛ මෙම පාලන ආරක්ෂක තේවා මඩුල්ල මනාව සංවිධාන ගත වී දවසේ විසි හතර පැය පුරාම ද වසරේ තුන්සිය හැටපස් දවසේම ද නිබඳවම ශ්‍රී මහා බෝධීන් වහන්සේ ආරක්ෂා කිරීමට කැප වී ඇත. මනා දහම් දැනුමකින් යුත් ශ්‍රද්ධා සම්පන්න පංච සීලය ආරක්ෂා කරන්නාවූ ද මනා දේහ විලාසයකින් යුත් නිරෝගී සෞඛ්‍යය සම්පන්න නායකත්වයට උචිත රාජකාරි මඩුල්ලක් ශ්‍රී මහා බෝධි වහන්සේගේ රාජකාරියේ යෙදවීමට පැරණි විහාර ගම් වැසියෝ වග බලා ගත්හ (සිරිනිවාස හිමි 2007, 26).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

වෙල්ලිදුර වංශික රාජකාරි මණ්ඩලයේ නව වාස භූමිය පෙර සඳහන් කළ විහාර ගම් නවය වුවද ඊට පෙර මොවුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේ අබියස පූජා නගරයේ ම පදිංචිව සිට ඇති අතර වර්ෂ 1815 දී ඉංග්‍රීසි ජාතිකයින් ශ්‍රී ලංකාව මුළුමනින්ම ගිවිසුම් ප්‍රකාරව තම පාලනයට යටත් කර ගැනීමත් සමග අනුරාධපුර පූජා නගරය ආශ්‍රිතව කච්චේරි, උසාවි, කන්තෝරු, පොලීසිය ආදිය ඉදිකරමින් වෙනම පාලන නගරයක් බවට පත් කරමින් ඔවුනගේ බලය ව්‍යාප්ත කරන විට වෙල්ලිදුර වංශික ජනතාව තම තරුණ ගැහැණු දරුවන්ගේ හා බිරින්දෑවරුන්ගේ ආරක්ෂාව පතා ඝන වනයෙන් වටවූ වත්මන් විහාර ගම් පෙදෙස දෙසට සංක්‍රමණය වී ඇත (චන්ද්‍රසේකර, 2022: 1102-1104).

මොවුන්ගේ ආරම්භය පිළිබඳ ව අධ්‍යයනයේ දී විවිධ ජනප්‍රවාද හා ලිඛිත සාදක ද හමු වේ. ශ්‍රී මහ බෝධිය රැකබලා ගැනීමට පැමිණි වෙල්ලිදුර වංශික පිරිස මෙරටෙහි පදිංචිව සිංහල සමාජයට අනුගත වූ පිරිසක් බව කාව්‍යශේඛරයේ මෙසේ දක්වයි.

මහබෝ රකින ලෙස - සැලසු බෝ කලක් වැස<br>
එමහ බෝ අබියස - විසූ කුලයන් මෙලක මුල් බැස<br>
සිරි සගබෝ නිරිඳු - විකුම් වැඩි මහසෙන් රඳු<br>
කිත්සිරි මේ නිරිඳු - බුජස් මහනම කුමර දස් රදු

(ගම්ලත්, 2019)

ඒ අනුව ක්‍රි.ව. 251 සිට 432 දක්වා ලක් ඉතිහාසයේ මිනිපේ ද්‍රෝණියේ ලම්භකර්ණ පරපුරට අයත් සිරි සගබෝ, මහසෙන්, කිත්සිරිමෙවන්, බුද්ධදාස, මහානාම, හා කුමාරදාස ආදී රජවරුන් පැවත එන්නේ ද සිරිමා බෝධිය මෙරටට වැඩම කරවූ පරම්පරාවලින් බව කියැ වේ (කරුණානන්ද 2007: 33).

ශ්‍රී මහා බෝධි වහන්සේට "බෝධි රාජයාණන් වහන්සේ" යන තත්ත්වය ආරූඪ කළ අතරම බෝධි ගුප්ත කුමරු ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ "ලක්දිව ජය මහ ලේනාවෝ" තනතුරට පත් කරන ලදි. එම ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ලක්දිව ජය මහා ලේනාවෝ තනතුර දරන්නාගේ මනා අනුශාසනය පරිදි ලක්දිව සියලු අතීත රජුන් පාලනය ගෙන ගියහ (දිසානායක, 2002: 75).

"කිඹුල්වත් පුර ශාක්‍ය වංශයෙන්" පැවත ආවා වූ " බෝධි ගුප්ත කුමරුන්ගෙන් හා සුනන්දා කුමරියගෙන්" "ලක්දිව ආර්ය බෝධි වංශයෙන්" පසු කලෙක ඇරඹී "ශ්‍රී සංඝබෝධි රාජ වංශය" වර්තමානයේ දී "වෙල්ලිදුර වංශය" ලෙස හඳුන්වනු ලබයි. ශ්‍රී මහා බෝධින් වහන්සේ ලක් පොළොවේ රෝපණය කර අවසානයේ මිහිදු මහ රහතන් වහන්සේ හා දෙවන පෑතිස් රජු බෝධි ගුප්ත කුමරු හා සුමිත්ත කුමරු තමන් සමීපයට කැඳවා ඔවුන්ට තානාන්තර සහ ගම් බිම් ප්‍රදානය කර තිබේ (වාච්චගේ, 2022: 375).

### 3.1. වෙල්ලිදුර වංශිකයන් බෝධි ආරක්ෂාව වෙනුවෙන් දිනපතා සිදු කළ කාර්යයන් සහ වතාවත්

ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම කරවීමේ ගමනේ දී ලංකාවට පැමිණි අටළොස් කුලයක පිරිස බෝධින් වහන්සේ වෙනුවෙන් මහ බෝ මගුල පැවැත්වීම සඳහා ඒ ඒ රාජකාරි භාරව කටයුතු කළහ (දීපවංසය, පරි 16, 35-39 ගාථා). ඔවුන් අතරින් ප්‍රධානීන් වූ බෝධිගුප්ත කුමාරයා ඇතුළු කුමාරවරු ඔවුන්ට පැවරුන විශේෂ රාජකාරි භාරව සිටියහ (දිසානායක, 2002:75).

ශ්‍රී මහා බෝධින් වහන්සේ උදෙසා සිදු කරනු ලබන දෛනික වතාවත් වෙනුවෙන් විහාර ගම්වල පිරිස් වල කාර්යභාරය සම්බන්ධයෙන් විහාර ගම් නවයෙහි දැනට මහදුර තනතුර දරණ මංජු මහතා සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී අනාවරණය වුයේ, සෑම අවස්ථාවකම එම ස්ථානයේ තේවාවන් ඉටු කිරීම සඳහා පිරිසක් අනිවාර්යයෙන් රැඳී සිටිය යුතු බවයි. එසේම ගමකින් ගමකට එම පිරිස් දින තුනකට වතාවක්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

මාරු වෙමින් එම තේවාවන් ඉෂ්ඨ සිද්ධ කරනු ලබයි. ඒ අනුව ගම් නවයේම පිරිස් තේවාවන් සඳහා සහභාගි වෙති. එසේ පැමිණෙන එක් කණ්ඩායමක් සඳහා පුද්ගලයන් තිදෙනෙක් අයත් වෙති. ඒ ගම්දුරයා සහ ගම්වැසියන් දෙදෙනෙකු වශයෙනි. ශ්‍රී මහා බෝධිය අසල තේවාවන් සිදු කිරීමේ දී ප්‍රධාන වශයෙන් ගම්දුරයා විසින් සිදු කරනු ලබන කාර්යයන් කිහිපයකි. ඔහුගේ සහයට අනෙක් ගම් වැසියන් දෙදෙනා රැඳී සිටියි. ගම්දුරයා විසින් සිදු කරනු ලැබූ කාර්යයන් මෙසේය.

- බෝධිය අභියස කන්නලව් කිරීම
- යාතිකා කිරීම
- භාර වීම
- භාර ඔප්පු කිරීම

වැඩි දුරටත් මෙම කාර්යයන් සිදු කිරීම පිළිබඳව හඳුනාගැනීමේ දී, ඒ සඳහා එම ස්ථානයට සහභාගී වන ගම්දුරයන් සහ ගම් වැසියන් කොණ්ඩය පිටුපසට බැඳීම අනිවාර්ය වේ. එසේම සුදු වතින් සැරසී සිටිය යුතුය. උරහිසට සළුවක්ද පැළඳිය යුතුය. එලෙසින් කොණ්ඩය පිටුපසට බැඳ සුදු හැඳ නොමැති වෙල්ලිදුර වංශිකයන්ට එම කාර්යයන් සඳහා සහභාගී වීම තහනම්ය. මෙහි දී ගම්වැසියන් ගම්දුරයාගේ අණ පිලිපැදීම අනිවාර්ය බවත් ය (ජයවර්ධන බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡා, 2020.10.10).

සාම්ප්‍රදායික විහාර ගම් වාසීන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ආරක්ෂා කිරීමේ කාර්යයභාරය තුළ විවිධ තනතුරු දරමින් ඒ සඳහා සුවිශේෂී සේවාවක් සිදු කරනු ලබන පිරිසක් ද වේ. ඒ සම්බන්ධයෙන් විහාර ගම් නවයෙහි දැනට මහදුර තනතුර දරන මංජු මහතා සමග පවත්වන ලද සාකච්ඡාවේ දී එම තණතුරු සහ ඊට අදාළ කාර්යභාරයන් මෙසේ පෙන්වා දෙන ලදි.

### 3.1.1. කපුරාල

කපුරාල වශයෙන් හඳුවන්වනු ලබන්නේ ගම්දුරයා සහා ඔහුගේ සහයට පැමිණෙන ගම්වැසියන් දෙදෙනාට අමතරව ශ්‍රී මහ බෝධින් වහන්සේ අසළ තේවාවට පැමිණෙන විහාර ගම් වාසීන් කිහිපදෙනෙකි. මොවුන් පස් දෙනෙකුගෙන් යුතු කණ්ඩායමකි. එම පස් දෙනාගෙන් වැලි මළුව සඳහා දෙදෙනෙක් ද මැද මළුව සඳහා එක් අයෙක් ද උඩ මළුව සඳහා එක් අයෙක් ද දේවාලය අසළ එක් අයෙක් ද වශයෙන් රාජකාරි කටයුතු සඳහා බෙදී යයි.

කපු වෘත්තිය ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ ලංකාවට වැඩම කළ අවධියේ දී ඒත් සමග පැමිණි බ්‍රාහ්මණ හෙවත් බමුණු වංශිකයන්ට පැවරී තිබුන කටයුත්තකි. දෙවියන් වෙනුවෙන් ස්තෝත්‍ර ගායනය සිදු කරනු ලබන්නේ බ්‍රාහ්මණ වංශිකයන් වීම එයට හේතුවයි. එකල බමුණු කුලයේ නායකයාට හිමි වූ රාජකාරිය වූයේ නිරන්තරයෙන් පැමිණ මහා බෝධින් වහන්සේට ශාන්තිය ප්‍රාර්ථනා කිරීමය. බ්‍රාහ්මණ වංශිකයන්ට උරුම වූ මෙම රාජකාරිය වෙල්ලිදුර වංශිකයන් අතට පත් වූ ආකාරය පිලිබඳව ඉතිහාසයේ කිසිදු සඳහනක් නොමැත. එහෙත් මෙම සේවාව ඔවුන් යටතට අයත් වූ දා පටන් එය අඛණ්ඩව පවත්වාගෙන ඒමට වෙල්ලිදුර වංශිකයන් කටයුතු කර ඇත. කපු මහත්වරුන්ට පැවරී ඇති ප්‍රධාන රාජකාරිය වන්නේ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ භාරව වැඩ වසන කලු දේවතා බණ්ඩාර දෙවියන් ප්‍රධාන අනෙකුත් දෙවිවරුන්ට යාතිකා කිරීමයි. මෙම කාර්යයන්ට අමතරව බෝධින් වහන්සේ අසල සිදු කෙරෙන අලුත් සහල් මංගල්‍යය, කාර්ති උත්සවය, නානුමුර මංගල්‍යය වැනි උත්සව සඳහාද ඔවුන් සහභාගී විය යුතුය.

### 3.1.2. මුර සේවය

මුල් කාලයේ වෙල්ලිදුර වංශිකයන් බෝධි ආරක්ෂකයින් වශයෙන් ඔවුනට උරුම වූ සේවය ඉටු කිරීම සඳහා සිය කැමැත්තෙන්ම ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ අභිමුවට පැමිණියහ. එකල විහාර ගම් වාසි සෑම වැඩිහිටි පිරිමි පුද්ගලයෙක්ම අවුරුද්දකට වතාවක් බෝධින් වහන්සේ රැක


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ගැනීම සඳහා දින දෙකක මුර සේවා කාලයකට අනිවාර්යයෙන් වාර්තා කළ යුතු විය.

ඒ අනුව බෝධි ආරක්ෂකයින් විසින් සිදු කරනු ලබන කාර්යයන් අතර ප්‍රධාන කාර්යයක් ලෙස " මුර සේවය" හඳුනාගත හැකිය. විහාර ගම්වල ජීවත් වන වෙල්ලිදුර වංශික පරපුරට අයත් මුරකරුවන් විසින් "ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ මුරකරු" යන ලාංඡනයක් පැළඳ සිටියි. ඊට අමතරව ඔවුන් සුදු වතින් සැරසී එක් උරයක සිට පපුව හරහා පහලට සිටින සේ වාපතයක් පැළඳ සිටිති. මුර සේවය සඳහා පැමිණෙන ගම් වැසියන් නොකඩවා වරු හතරක් එනම් දින දෙකක් මුර රාජකාරියේ යෙදී සිටිති. එය මුර වට්ටමක් යනුවෙන් හැඳින්වේ. එක් මුර වට්ටමක් අවසානයේ දී විහාර ගම් අතරින් වෙනත් ගමක කණ්ඩායමක් මුරට පැමිණේ. මේ අනුව එක් ගමකට මුර සේවය පැමිණෙන්නේ දින 18 කට එක් වරක් බැගින් ය. එනම් එක් ගමකින් ගම් වැසියන් තිදෙනෙකු දින 18කට වරක් දින දෙකක මුර සේවය වෙනුවෙන් ශ්‍රී මහා බෝධින්වහන්සේ වෙත පැමිණිය යුතුය. ගම්වල ජන සංඛ්‍යාව සලකා බලා ඒ අනුව මෙම බෙදීම සිදු කරනු ලබයි. පුරුෂ පාර්ශවයේ සියලුම දෙනා මේ සඳහා සහභාගී වේ. මහදුරයා සහ අදාළ ගමෙහි ගම්දුරයාගේ අනුදැනුම මත මෙම ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක වේ. කපුටන්, වඳුරන් වැනි සතුන් එළවීම මොවුන්ගේ ප්‍රධාන රාජකාරිය වන අතර එයට අමතරව ශ්‍රී මහා බෝධින් වහන්සේට හානියක් පමුනුවන කිසිදු ක්‍රියාවලියක් නොවීමට ද මොවුන් වගබලා ගත යුතුය.

අතීතයේ පටන් මොවුන් ඉතා නොබියව ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ ආරක්ෂා කිරීමට කටයුතු කළ අතර ද්‍රවිඩ ආක්‍රමණ හමුවේ බෝධින් වහන්සේ අසල පරිවාර බෝධින් වහන්සේලා රෝපණය කරමින් එය හඳුනාගැනීමට නොහැකි වන සේ සගවා ඇත. තව ද සටන් කලාව ප්‍රගුණ කළ බෝධි ආරක්ෂකයින් කිහිපදෙනෙකු නිරන්තරයෙන් බෝධිය අසල රැඳෙමින් එහි ආරක්ෂාව තහවුරු කළහ. ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ රැකගැනීමට වෙල්ලිදුර වංශික බෝධි ආරක්ෂකයින් ක්‍රියාකල ආකාරය මැනවින් විදහාපාන මෑත කාලීන සිදුවීම් කිහිපයක් ඔස්සේ එය තවදුරටත් තහවුරු කළ හැකිය. 1923 දී කතෝලික භක්තිකයෙකු වූ කරත්ත ජෝන් නමැති පුද්ගලයා කෙටේරියක් ඉනේ සගවාගෙන බෝධින් වහන්සේට දෙවරක් කෙටීමට පැමිණි අවස්ථාවේ දී බෝධින් වහන්සේ ආරක්ෂා කිරීමට වෙල්ලිදුර වංශිකයන් කටයුතු කළහ. 1985 දී ශ්‍රී මහා බෝධින් වහන්සේට ද්‍රවිඩ කොටි ත්‍රස්තවාදීන් විසින් එල්ල කළ ප්‍රහාරයේ දී ද වෙල්ලිදුර වංශික බෝධි ආරක්ෂකයින් තම රාජකාරිය මැනවින් ඉෂ්ඨ කරමින්ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ රැකගත්හ (ජයවර්ධන බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡා, 2020.10.10).

### 3.2. අතීතයේ දී බෝධීන් වහන්සේගේ සතර මංගල්‍යය ඇතුළු විශේෂ උත්සව උදෙසා වෙල්ලිදුර වංශියකන්ගේ දායකත්වය

ශ්‍රී මහා බෝධීන් වහන්සේට පිරිසිදු සිතින් පූජා පැවැත්වීමෙන් මෙලොව ජීවිතය මෙන්ම පරලොව ජීවිතය ද සාර්ථක වන බවට ජනතාව අතර විශ්වාසයක් පවතී. බෝධීන් වහන්සේ ජීවමාන බුදුරජාණන් වහන්සේට සමාන කොට සැලකීම මෙන්ම බෝධිය යනු 'බුද්ධත්වය' ලෙස සැලකීම එයට හේතු වේ. දිනපතා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පැවැත්වෙන පූජාවන්වලට අමතරව අවුරුදු පතා ශ්‍රී මහා බෝධින් වහන්සේ උදෙසා පැවැත්වෙන පූජාවන් ද පවතී. ඒ අතරින් ප්‍රධාන පූජා සතරක් "හතර මංගල්ල" යනුවෙන් පොදුවේ හැඳින්වේ. එනම්,

- දුරුතු මංගල්‍යය
- පරණ අවුරුදු මංගල්‍යය
- නානුමුර මංගල්‍යය
- කාර්තික මංගල්‍යය

(ධම්මරක්ඛිත හිමි 2000, 384-392)


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

යනු එම පූජාවන් සතරයි. මුල් කාලීනව රජවරුන් සහ ඇමතිවරුන් මෙම මංගල්‍යයන් සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ අතර පසුකාලීනව මෙහි මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේලා විසිනි. එසේම ඒ සඳහා මුල් කාලයේ පටන් ප්‍රධාන වශයෙන් දායකත්වය සපයා ඇත්තේ විහාර ගම් වාසී වෙල්ලිදුර වංශිකයන්ය.

### 3.2.1. දුරුතු මංගල්‍යය

මෙය අලුත් සහල් මංගල්‍යය නමින් ද හැඳින්වේ. දුරුතු මස පොහොය දිනයේ දී මෙම මංගල්‍යය පවත්වන බැවින් දුරුතු මංගල්‍යය යනුවෙන් ද වරෙක අලුත්සාල් මංගල්‍යය නමින් ද හැඳින්වේ. එයට හේතුව වන්නේ මහ කන්නයේ අස්වැන්නෙන් ලබාගත් අලුත් සහල්වලින් සාදාගන්නා කිරි ආහාර පූජාවක් මෙහි දී පූජා කිරීමයි. මුල්කාලීනව මෙම මංගල්‍යය සඳහා අස්වැන්න ලබාගැනීමට යොදාගෙන ඇත්තේ ශ්‍රී මහා බෝධියට නින්දගම් වශයෙන් ලැබුන ඉඩම්ය. රාජ නියමයෙන් පැවරී තිබුණ මෙම මංගල්‍යයේ භාරකරත්වය හිමිව තිබී ඇත්තේ අනුරාධපුර බුලංකුලම පවුලේ ඥාතීන්ටය. පුරාතන කාලයේ ගොවිතැන් කිරීමේ මුල් පියවර වශයෙන් අලුත් සහල් මංගල්‍යයට භාර වී බෝධිය ඉදිරියේ ප්‍රතිඥාවක් දීම අනිවාර්ය සිරිතක් විය. එය මුළු රටටම පොදු ප්‍රතිඥාවකි. කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය බුදු දහමත් සමග බැඳී තිබූ ආකාරය ඒ තුළින් මනාව පිළිබිඹු වේ. ගොවියාට බෝධියත්, බෝධියට ගොවියාත්, ගොවිතැන රජයටත්, රජය බෝධියටත් වශයෙන් මෙම සම්බන්ධය අඛණ්ඩව පැවතුනි (ධම්මරක්ඛිත හිමි 2000, 385-386).

### 3.2.2. පරණ අවුරුදු මංගල්‍යය

මෙම මංගල්‍යය අලුත් අවුරුදු උදාවට පෙර අප්‍රේල් මස මුල් දින කිහිපය තුල පැවැත්වේ. සිංහල අලුත් අවුරුද්දට දින පහකට පමණ පෙර කෙම්මුර දිනයක දී මෙම පූජාව පැවැත්වේ. මෙම මංගල්‍යයේ දී නව වසරට සෙත් පතා බුද්ධ පූජා, බෝධි පූජා සහ දේව පූජා ආදිය ද සිදුකෙරෙයි. විශේෂයෙන් බෝධීන් වහන්සේ අභියස ගිලන්පස පූජාවක් පවත්වා පසුදින රන් පාත්‍රයෙන් කිරි ආහාර පූජාවක් පැවැත්වීම සිදු කරනු ලබයි. අලුත් අවුරුදු මංගල්‍යය ද විශේෂ නිමිත්තක් නැතිනම් නැකතක් මූලික කරගෙන පැවැත්වේ. මෙම මංගල්‍යය සඳහා ශ්‍රී මහා බෝධි විහාරයේ භික්ෂූන් වහන්සේලා ද විහාර ගම්වල වැසියන් ද අනිවාර්යයෙන් සහභාගි විය යුතුය. අලුත් අවුරුදු මංගල්‍යය පවත්වා අවසන් වන තුරු එම ස්ථානයේ ස්ථානාධිපතින් වහන්සේ අරුණක් ගත කිරීම සඳහා එම ස්ථානයෙන් බැහැර නොයයි. මෙය පුරාණයේ සිට පැවත එන වැදගත් චාරිත්‍රයකි. මොන යම් වූ හේතුවක් නිසාවෙන්වත් පන්සලට හෝ මතක දානෙකටවත් උන්වහන්සේ බැහැර නොයයි. අලුත් අවුරුදු මංගල්‍යය සාමාන්‍යයෙන් පවත්වනු ලබන්නේ පෙරහැර වශයෙනි. වෙසක් පුර පසළොස්වක පොහොයට සතියකට පමණ පෙර පැමිණෙන 'විසා නැකතට' එළඹීමට පෙර මෙම මංගල්‍යය පැවැත්විය යුතුය. අතීතයේ දී විහාර ගම්වල වැසියන් මෙම මංගල්‍යය සඳහා වළං හා ආයුධ සැපයීම සහා හක්ගෙඩි පිඹීම කළ යුතු විය (ස්වර්ණසිංහ, 2002: 42-43).

### 3.2.3. නානුමුර මංගල්‍යය

නානුමුර මංගල්‍යය යනු ශ්‍රී මහා බෝධීන් වහන්සේ නැවීමේ චාරිත්‍රයයි. මෙය වෙසක් පෝයට පළමුව විසා නැකත ද උදා වෙනවාත් සමගම සතියේ කෙම්මුර දිනයක විශේෂයෙන් සෙනසුරාදාවක පවත්වන මංගල්‍යයකි. දැඩි නියගය නිසා පීඩා විඳින පළාත්වාසීන් හා මහා විහාරයේ හාමුදුරුවන් අතර ඇති වූ කතිකාවතක ප්‍රතිඵලයක් වශයෙන් මෙම චාරිත්‍රය ආරම්භ වී ඇත. පෙර රජ දවස පෙරහැරෙන් ගොස් තිසා වැවෙන් පැන් රැගෙන විත් බෝධීන් වහන්සේ නැවීම මෙහි දී සිදුකරනු ලැබීය. මෙම මංගල්‍යයෙන් පසුව නියගය පහව ගොස් වර්ෂාව ඇති වේ. බෝධීන් වහන්සේට වැස්ස වස්සන්නට හැකිවීම පිළිබඳව මෙරට


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

බෞද්ධයන් තුළ පවතින විශ්වාසය නිසාවෙන් මෙම පැන් පෙරහැර පවත්වා වැස්ස ඉල්ලා සිටීමේ චාරිත්‍රය පැවැත එයි.

මෙම මංගල්‍යය පිළිබඳව වෙල්ලිදුර වංශිකයන් අතර කියවෙන එක් ජනප්‍රවාදයක් පවතී. ඒ අනුව අවුරුද්දකට එක් වතාවක් පමණක් පැවැත්වෙන මෙම නානුමුර මංගල්‍යය බෝධින් වහන්සේ වැඩමවූ කාලයේ දී පවත්වා ඇත්තේ උදුවප් මාසයේ දී ය. උදුවප් මාසයේ පුර අටවක දවසේ සිට දවස් හතක් බෝධි ගුප්ත කුමාරයා හෝ ඔහුගෙන් පැවත එන අයෙක් හිස සෝදා නාපිරිසිදුව, ස්ත්‍රියක් උයා දුන් කෑමක් හෝ නොකා මෙම චාරිත්‍රය සඳහා පේවී ඇත. ඉන් පසුව ඔහු පුර පසළොස්වක පෝය දිනයට පෙර දිනයේ බෝ මළුවට පැමිණ තිසා වැවට ගොස් රන් කෙණ්ඩියකට පැන් පෙරා ගෙන උඩු වියන් සහ පාවඩ ඇතිව වඩම්මවාගෙන ඇවිදින් එදින රාත්‍රියේ බෝධියට පැන් වඩා නානුමුර පූජාව පවත්වා ඇත. පසුදා උදෑසන බෝධිගුප්ත කුමාරයා විසින් බෝධින් වහන්සේට රන් පට, රිදී පට බැද කෝසෙයිය පට සිවුරක් පොරවා මෙම චාරිත්‍රය අවසන් කර ඇත.

බක් මහේ දී සිංහල අලුත් අවුරුදු උදාවෙන් පසුව බෞද්ධයන්ට දක්නට ලැබෙන පළමු පිංකම වන්නේ ජය ශ්‍රී මහා බෝධියට ආභරණ පැළඳවීමයි. මෙම උත්සවය පැවැත්වෙන්නේ නානුමුර මංගල්‍යය පැවැත්වෙන දිනයට පෙර දින හවසය. මෙම උත්සවය සඳහා සියලු දෙනාට සහභාගී විය නොහැකි අතර මූලික වශයෙන් සහභාගී වන්නේ මහා විහාරයේ හාමුදුරුවරුන් සහ ගිහියන් වශයෙන් වෙල්ලිදුර පරපුරෙහි ප්‍රධානීන් කිහිපදෙනෙකු පමණි. සාමාන්‍යයෙන් ආභරණ පළඳවන්නේ ගිහියන්ට නැතිනම් රජවරුන්ට වන අතර ගස්වලට ආභරණ පැළඳවීමක් පිළිබඳව තොරතුරු ඉතිහාසයෙන් හමු නොවෙයි. නමුත් බෝ රුක රජ කෙනෙක්ය යන විශ්වාසය බෞද්ධයන් තුළ පවතින නිසාවෙන් මෙම චාරිත්‍රය සිදු කරනු ලබයි. බෞද්ධයන් විසින් බෝධියට බෝ රජු, බෝධි රාජයා යනුවෙන් ඇමතීම තුළින් බෞද්ධ සිත් තුළ රජ කෙනෙකුට හා සමාන ගෞරවයක්බෝධිය කෙරෙහිද ඇති බව ප්‍රකට වේ. අභිෂේක මංගල්‍යය හෙවත් ඔටුනු පැළැඳීම රජ කෙනෙකුගේ ජීවිතයේ සුවිශේෂීම අවස්ථාවන්ගෙන් එකකි. එදින සිදුවන එක් චාරිත්‍රයක් ලෙස රජතුමාට ආභරණ පළඳවයි. සක්විති රජෙක් හා සමාන බුදු රජාණන් වහන්සේට ද ආභරණ පැළඳවීමට අවශ්‍ය යැයි සිතූ බෞද්ධයන් උන්වහන්සේ ජීවමානව නොමැති නිසාවෙන් ජීවමානව පවතින ශ්‍රී මහා බෝධින් වහන්සේට ආභරණ පැළඳවීමට සිතීමෙන් මෙම චාරිත්‍රය ආරම්භ විය. ධර්මාශෝක රජතුමාද මෙම චාරිත්‍රය සිදු කල බව මහාවංසයේ සඳහන් වේ

බෝධින් වහන්සේට පළන්දන රන් සළු හා රන් ආභරණ සාමාන්‍ය දිනවල බෝධීන් වහන්සේ සමීපයේ පිහිටි බුදු ගෙය තුළ තැන්පත් කර ඇත. මෙම සියල්ල රන් වැට සහිත උඩමළුවට රැගෙන එනු ලබන්නේ වෙල්ලිදුර පරපුරේ වැඩිහිටියන් කිහිප දෙනෙකු විසිනි. එම පිරිසත් මහා විහාරයේ නායක හාමුදුරුවන් ඇතුළු සංඝයා වහන්සේලා කිහිප නමකුත් උඩ මළුවට පැමිණීමෙන් පසුව රන් වැට වැසෙන පරිදි සිවුරු යොදාගනිමින් එම ස්ථානය ආවරණය කරනු ලබයි. එබැවින් මෙම චාරිත්‍රය සාමාන්‍ය ජනයාට දැකගත නොහැකිය. එයට හේතුව වන්නේ රාජාභිෂේකයක් වුවද සෑම අයෙක්ටම දැකීමට නොහැකි වීමයි. උඩමළුවට වැඩම කළ නායක හාමුදුරුවෝ රන් පැහැගත් සිවුරුවලින් බෝධින් වහන්සේ ආවරණය කරනු ලබයි. ඉන් පසුව එක් එක් හැඩයෙන් යුතු රන් ආභරණ සමූහයක් එම රන් සළුව එතු රන් කද වටා පළඳවනු ලබයි. ඉන් පසුව සංඝයා වහන්සේලා විසින් උඩ මළුව අමදින අතර පසුව සියලු දෙනාම එක්ව ශ්‍රී මා බෝධින් වහන්සේ වන්දනා කරනු ලබයි. වර්තමානය දක්වා අඛණ්ඩව පැවැතීගෙන එන මෙම මංගල්‍යයේ ආරම්භය බෝධින් වහන්සේ වැඩමවූ අවධිය දක්වා දිවෙන


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

බවටත් මෙම මංගල්‍යය සඳහා රාජ්‍යය අනුග්‍රහය හිමි වූ බවටත් මෙම ජනප්‍රවාදය සාක්ෂි සපයයි (ධම්මරක්ඛිත හිමි 2000, 385-386).

### 3.2.4. කාර්තික මංගල්‍යය හා දර මිටි පෙරහැර

මෙය කාර්තු මංගල්‍යය, කාච්චි මංගල්‍යය හා දරමිටි පෝය යන නම්වලින් ව්‍යවහාර වේ. මෙම කාර්තික මංගල්‍යය පවත්වනු ලබන්නේ නොවැම්බර් මස පුර පසළොස්වක පොහොය දිනයේදී ය. සාමාන්‍යයෙන් 'කැති නැකත' උදාවන දිනය නිමිති කරගෙන බෝධීන් වහන්සේ අභියසත් රුවන්වැලිසෑය අභියසත් ගිලන්පස පූජාවක් හා මල් පහන් පූජාවක් පවත්වනු ලබයි. පසුදින රන් පාත්‍රයේ කිරි ආහාර පූජාවක් පවත්වනු ලබයි. මෙය අවුරුද්දේ අවසාන මංගල්‍යය වේ.

විසි වන සියවසයේ මුල් භාගය වන තෙක්ම ශ්‍රී මහා බෝධීන් වහන්සේ අවට ප්‍රදේශය ඝන වනාන්තරයෙන් වට වී තිබින (දිසානායක, 2003: 44). නටබුන් වූ රුවන්වැලි මහා සෑය ඇතුළු අනෙකුත් පූජනීය ස්ථාන ද එම වනාන්තරයෙන් වට වී තිබිනි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා වූ ප්‍රාකාරය පවා බොහෝ තැන්වලින් බිඳ වැටී අනාරක්ෂිත තත්ත්වයක පැවතිනි. ශ්‍රී ලංකාව එසේ අරාජික වූ කාලයේ පවා වෙල්ලිදුර වංශිකයන් ශ්‍රී මහා බෝධිය රැකගැනීම වෙනුවෙන් වෙහෙස වූහ. එය තවදුරටත් සනාථ වන කරුණක් වශයෙන් දර මිටි පෙරහැර නම් කළ හැකිය. මෙම චාරිත්‍රය ආරම්භ වී ඇත්තේ අලි ඇතුන් වැනි සතුන්ගෙන් බෝධීන් වහන්සේ ආරක්ෂා කරගැනීමේ අරමුණිනි.

මුල් කාලීනව බෝධි ආරක්ෂක විධිවිධානයක් වශයෙන් පැවති මෙම කාර්යය කෙමෙන් කෙමෙන් චාරිත්‍රයක් බවට පත්විය. මෙය පැවැත්වෙනු ලබන්නේ දර මිටි පෝය දිනයේදී ය. දරමිටි පෝය යනුවෙන් හඳුන්වන්නේ ඇසළ පොහොයයි. එකල අනුරාධපුරයට වන්දනාව සඳහා වන්දනාකරුවන් වැඩි වශයෙන් පැමිණ ඇත්තේ පොසොන් පොහොයට නොව ඇසළ පොහොයටය. එදිනට වන්දනාකරුවන් බෝ සමිඳුන් වන්දනා කිරීමට පැමිණියේ දර මිටියක්ද සමගිනි. එම දර මිටිවලින් බෝධීන් වහන්සේ සතර පැත්තේ ගිනිගොඩවල් සතරක් ගසමින් රැය එළිවන තුරු නොනිදා බෝධීන් වහන්සේට හානි කිරීමට පැමිණෙන සතුන්ගෙන් විශේෂයෙන්ම අලි ඇතුන්ගෙන් බෝධීන් වහන්සේව ආරක්ෂා කර ඇත. ඒ සඳහා ප්‍රමාණවත් දර එකල වන්දනාකරුවන්ට සැපයීමට නොහැකි අවස්ථාවලදී දර සපයා ඇත්තේ වෙල්ලිදුර පරපුරෙහි පිරිස විසිනි. බොහෝ විට දර මිටි රැගෙන විත් ඇත්තේ ගැමි කාන්තාවන්ය. ඒ අනුව ඇසළ පෝය, දරමිටි පෝය නමින් ප්‍රසිද්ධ විය (දිසානායක, 2003: 44).

### 3.3. වෙල්ලිදුර වංශිකයන් ශ්‍රී මහා බෝධියේ කටයුතු කිරීමේ දී සකසා ගත් පරිපාලන ව්‍යුහය

මේ සම්බන්දයෙන් විහාර පාලුගම ගමෙහි ගම්දුරතනතුර දරණ චන්ද්‍රපාල මහතා පවත්වන ලද සාකච්ඡාවේ දී හඳුනාගත හැකි වූයේ සම්ප්‍රදායික විහාර ගම් වැසියන්ගේ පරිපාලන ව්‍යුහය මූලික වශයෙන් නිලධාරී මට්ටම් කිහිපයකින් සැදී ඇති බවයි. එනම්,

මහදුර තනතුර

↓

ගම්දුර තනතුර

↓

වෙල් විදානේ තනතුර

↓

ගම්වැසියන්



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

### 3.3.1. මහදුර තනතුර

වැඩි දුරටත් මහදුර තනතුර දරන මංජු මහතා විග්‍රහ කලේ විහාර ගම් නවය තුළ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට රාජකාරි කටයුතු කරන අය අතරින් ගම් නවයටම ප්‍රධානියෙකු වශයෙන් එක් පුද්ගලයෙකු පත් කරයි. ඔහු "මහදුරයා" වූ අතර එම තනතුර අතීතයේ දී හඳුන්වා ඇත්තේ "මහයා" යනුවෙනි. ඉතා මෑත භාගයේ දී අටමස්ථානාධිපති නාහිමිපාණන් වහන්සේලා විසින් මහයා යන්න වෙනුවට මහදුරයා යන නාමය යොදාගෙන ඇත. මහදුරයා යන්න නිර්වචනය කරන සෝරත හිමියන් දක්වනු ලබන්නේ මහා ආර්ය, ආදිපාද, මහ ඈපා, යුවරජ යන්න ද එහි අරුත වන බවයි. යථෝක්ත අර්ථයන් විමසා බැලීමේ දී පෙනී යන්නේ මහයා යනු කිසියම් ආකාරයක ප්‍රභුවරයෙකු වූ බවයි. අතීතයේ නුවර කලාවියේ මහවන්නියා ලෙස හඳුන්වා ඇත්තේ මහයා බවද සැලකේ. අනුරාධපුර දිසාවේ වෙනුවෙන් දිසාව පාලනය කිරීම මහවන්නියාගේ ප්‍රධාන කාර්යය වූ අතර එවකට මහයා පදිංචිව සිටි නුවර වැව වලව්ව පාරම්පරිකව මෙම අයිතිය භුක්ති විඳි බව සඳහන් වේ. ජනප්‍රවාද වලට අනුව මහයා ඉතාමත් බල සම්පන්න පුද්ගලයෙකි. බෝධීන් වහන්සේ වැඳුම් පිදුම් කිරීමට පැමිණෙන රජුට එරෙහි වීමට පවා ඔහුට බලයක් තිබුණි. ඒ අනුව මහයාගේ අවසරයකින් තොරව රජුට පවා බෝධීන් වහන්සේ වැඳුම් පිදුම් කිරීමට තහනම් විය. රජුට විරුද්ධ වුවත් මහයාට දඬුවම් කිරීමට රජුට හැකියාවක් නොපැවතුනි. මහයා සතු බලය රජුට වඩා වැඩි වීම එයට හේතුව බව *ජනප්‍රවාද තුළ තවදුරටත් සඳහන් වේ* (චන්ද්‍රපාල බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡාව, 2020.10.12).

මහදුර තනතුර පත්කරනු ලබන්නේ වරිග සභාව මගිනි. වරිග සභාවට අයත් වන්නේ ගම්දුරයන් සියලුම දෙනා සහ වයෝවෘද්ධ පරිනත වෙල්ලිදුර වංශිකයන් කිහිප දෙනෙකි. මහදුර තනතුර සඳහා පත්වන්නා මූලික වශයෙන් සැපිරිය යුතු සුදුසුකම් කිහිපයක් පවතී. එම සුදුසුකම් මෙසේය.

- වෙල්ලිදුර වංශිකයෙක් වීම
- බෞද්ධයෙක් වීම
- උභය කුල පාරිශුද්ධත්වය
- පරම්පරාවේ අයෙකු මහයා තනතුර දරා තිබීම
- යහපත් චරිතය
- මනා පෞරුෂය
- වැඩිහිටියන්ට ගරු කිරීම
- නිර්භීත වීම

වරිග සභාවේ අති බහුතරයකගේ කැමැත්ත මත පත්වන මහදුරයා හෙවත් මහයා පත්වීමෙන් පසු පත්වීම සඳහා තමන්ට පක්ෂපාතීත්වය ලබා නොදුන් පිරිසට දඬුවම් කිරීම හෝ ඔවුන්ගෙන් පළිගැනීම තහනම්ය. මහයා ලෙස පත්වන පුද්ගලයාට එම තනතුර ඔහුගේ ජීවිත කාලය පුරාවටම දැරිය හැකිය. ඔහු එම තනතුරෙහි අත්තනෝමතික ලෙස හැසිරුනහොත් ඔහුව එම තනතුරෙන් ඉවත් කිරීමේ බලය වරිග සභාවට හිමිය. එසේම ඔහු අකාලයේ මරණයට පත්වුවහොත් අනුප්‍රාප්තිකයෙකු ලෙස මහදුරයෙකු තෝරා පත්කරගැනීම සිදුකරනු ලබන්නේ පෙර පරිදි ගම් සභාව තුළ පවත්වනු ලබන ඡන්දයකිනි. ප්‍රධාන වශයෙන් මහදුරයෙකු සතු වගකීම් මෙසේය.

- ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැකබලා ගැනීම
- බෝධීන් වහන්සේ අසල තේවාවන් ඉටු කිරීම
- මුරකරුවන් රැගෙන යාම සහ එම ක්‍රියාවලිය පවත්වාගෙන යාම ක්‍රමානුකූලව සිදුවනවාද යන්න විමසා බැලීම
- විහාර ගම්වලට ගම්දුරයන් පත් කිරීම
- වරිග සභාවේ ප්‍රධානියා ලෙස කටයුතු කිරීම
- ගම් නවයෙහි වැසියන් අතර ඇති වන ගැටුම් විසඳීම

මෙම කාර්යයන් වලට අමතරව විල්ලිදුර වංශිකයන් වෙනුවෙන් ඉටුවිය යුතු සියලුම කාර්යයන් සහ තම වරිගය රැක ගැනීම ඔහුට පැවරී ඇත. එසේම ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දෛනික රාජකාරි


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කටයුතු සඳහා මහදුරයාගේ පැමිණීම අනිවාර්යය වේ (චන්ද්‍රපාල බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡාව, 2020.10.12).

### 3.3.2. ගම්දුර තනතුර

මහදුරයාට පසු සාම්ප්‍රදායික විහාරගම් වැසියන්ගේ පරිපාලන ධූරාවලියේ දෙවන මට්ටම වන්නේ ගම්දුර තනතුරයි. ගම්දුරයා යනු ගම්මානයෙහි ප්‍රධානියාය. විහාර ගම් නවය සඳහා වෙන් වෙන් වශයෙන් ගම්දුරයා නමින් හැඳින්වෙන ප්‍රධානීන් නව කෙනෙකු පත් කරනු ලබයි. ගම්දුරයා තනතුර පත් කරනු ලබන්නේ එම විහාර ගම්වල පිරිස අතරින් ශ්‍රී මහා බෝධීන් වහන්සේට රාජකාරි කිරීම සඳහා සුදුසුකම් ලබන අයගේ ප්‍රධානියා වශයෙනි. ගම්දුර තනතුර පත් කරනු ලබන්නේ එම විහාර ගමේ ගම්පංගුකරුවන් සහ එම විහාර ගමේ පුරාණ මහවෙලේ ගම්පංගුකරුවන් විසින් පවත්වනු ලබන ඡන්දයකිනි. වැඩිදෙනෙකුගේ කැමැත්ත ලබාගන්නා තැනැත්තා එම තනතුරට පත්කරනු ලබයි. ගම්දුර තනතුර ලබා ගැනීම සඳහා වෙල්ලිදුර වංශිකයෙකු සතු විය යුතු මූලික සුදුසුකම් කිහිපයක් පවතී.

- වෙල්ලිදුර වංශිකයෙකු වීම
- චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව මනා දැනුමක් තිබීම
- ගමේ කිසිම පුද්ගලයෙකු සමග ගැටුම් ඇති කරගෙන නොතිබීම
- එක් දිනක් හෝ සිරභාරයේ නොසිටි අයෙකු විය යුතුවීම

ගම්දුරයා විසින් දින දහ අටෙන් දහ අටට තම තමන්ගේ ගම්මානයට පැවරෙන මුර සේවය සඳහා මුර කරුවන් තෝරා ගෙන ඔවුන් සමග දින තුනක එනම් පළමු දින දහවල් දොළහේ සිට දින දෙකක් හා තෙවන දින දහවල් දොළහ වන තුරු මුර කිරීමේ කාර්යය ඉටු කල යුතුය. එහි දී කපු මහත්වරුන් ලෙස යාතිකා කිරීමේ කාර්යයද ඔවුන් විසින් සිදු කළ යුතුය. එමෙන්ම ගම්මානයේ සිටින සුදුසුකම් ලැබූ සියලු පවුල් සඳහා අනිවාර්යය මුර සේවය යෙදෙන දින දැක්වෙන ලැයිස්තුවක් ගම්දුරයාගේ නිවසේ ප්‍රදර්ශනය කළ යුතුය. තමාගේ රුචිකත්වය පරිදි මුර සේවාව සඳහා ගම්වැසියන් තෝරාගැනීම මොහුට සිදුකල නොහැකිය. එමෙන්ම මුර සේවය සඳහා පිටත් වීමට පෙර එම පිරිස තම රාජකාරිය වෙනුවෙන් මස්, මාංශ සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් තොරව දින කිහිපයක් ජේවිය යුතුය.

විහාර ගමක ප්‍රධාන වශයෙන් පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ ගම්දුරයා විසිනි. ගම්වැසියන් අතර කිසියම් අර්බුදකාරී අවස්ථාවන්හි එයට විසඳුම් සපයා දීමත්, ගම්මානයට අයත් ඉඩකඩම් ගම්මානයේ නොවන එනම් පිටස්තර පුද්ගලයන් අතට පත්වීම වැළැක්වීමත් මොහුගේ කාර්යයයි. එමෙන්ම වෙල්ලිදුර වංශිකයන් තම කුලයෙන් පිටස්තර විවාහ සිදුකරගන්නා අවස්ථාවලදී ඒ පිළිබඳව වරිග සභාව දැනුවත් කිරීමත් එයට අවශ්‍ය විසඳුම් ලබා ගැනීමත් ඒ පිළිබඳව ගම්වැසියන් දැනුවත් කිරීමත් ගම්දුරයාගේ කාර්යයන්ට අයත්ය (චන්ද්‍රපාල බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡාව, 2020.10.12).

### 3.3.3. වෙල්විදානේ තනතුර

විහාර ගම් වල පාලන කටයුතු කිරීමේදී ගම්දුරයන්ට අමතරව "වෙල්දුරයා" හෙවත් " වෙල්විදානෙ" නමින් හැඳින්වෙන ප්‍රධානීන් නව දෙනෙකු පත් කරනු ලබයි. "වෙල්දුරයා" හෙවත් " වෙල්විදානෙ" නමින් හැඳින්වෙන තනතුර පත් කරනු ලබන්නේ එම ගමෙහි ගොවිතැන් කටයුතු පිළිබඳව සොයාබැලීම සඳහා ප්‍රධානියෙකු වශයෙනි. මෙම තනතුර පත් කරනු ලබන්නේ එම විහාර ගමේ ගම්පංගුකරුවන් සහ එම විහාර ගමේ පුරාණ මහවෙලේ ගම්පංගුකරුවන් විසින් පවත්වනු ලබන ඡන්දයකිනි. වැඩිදෙනෙකුගේ කැමැත්ත ලබාගන්නා තැනැත්තා එම තනතුරට පත්කරනු ලබයි. වෙල්දුරයා" හෙවත් "වෙල්විදානෙ" නමින් පත්වන පුද්ගලයාගේ අණ විධි විදාන ඉතාම තදින් ක්‍රියාත්මක විය. විදානේවරයෙකුගේ රාජකාරි කටයුතු වලට සියලුම ගම්පංගුකාරයින් රැස්කර


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

තබන ගොවි හමුවකදී පහත සදහන් තීරණ වලට එළඹෙනු ලබයි.

- වපුරන වී වර්ගය තීරණය කිරීම
- වනාත කොටන දිනය තීරණය කිරීම
- ඇළ වේළි සුද්ධ කරන දිනය තීරණය කිරීම
- වැටවල් අහුරන දිනය තීරණය කිරීම
- මුරපැළවල් ඉදිකරන දිනය තීරණය කිරීම
- වපුරන දිනය තීරණය කිරීම
- ගොයම් කපන දිනය තීරණය කිරීම
- යායට ගවයන් දක්කන දිනය තීරණය කිරීම
- වැටවල් නැවත කඩන දිනය තීරණය කිරීම

එම තීරණ ගැනීම සඳහා සියලුම ගම් පංගුකරුවන්ගෙන් කැමැත්ත විමසා එකගත්වයට පැමිණ ගිවිසගත් කොන්දේසි සහ එම වගකීම් පැහැර හරින ගොවීන් හට දඩ අයකිරීමද තදින්ම සිදු විය. ඒ ඔස්සේ ගමෙහි සියලු ගොවීන් සාමූහිකව මෙහෙයවා ගමක ස්වයංපෝෂිතභාවය මැනවින් ආරක්ෂා කිරීමට වෙල්විදානේ බැදී සිටියි. මෙලෙස විදානේවරයා ශ්‍රී මහා බෝධීන් වහන්සේට ආරක්ෂාව සලස්වන වෙල්ලිදුර ජන සමූහය ස්වයංපෝෂිතව තබයි. එය විදානේ සතු පරම වගකීමය. ඒ වෙනුවෙන් ඔහු සිය උපරිම කැපකිරීම සිදුකරනු ලබයි. හේන් ගොවිතැනේදී ඉරි වැල්ලට හේන් කෙටීම, මුල් කැටා හේන් කෙටීම ආදී වූ ක්‍රම මූලික වූ අතර ඒවායේ පැල් රැකීමද තදින්ම ක්‍රියාත්මක කරවීම විදානේ සතු රාජකාරියකි. මෙම සියලු රාජකාරීන් සඳහා විදානේවරයාට වී බුසලක බිම් ප්‍රමාණයකින් බුසල් කාලක් පමණ වී ගෙවනු ලබයි. විහාර ගමක ගම් පංගුකරුවන්ගේ හා පුරාණ මහවෙලේ ගම් පංගුකරුවන් වැඩි දෙනාගේ කැමැත්ත මත තේරී පත්වන විදානේ හට ශ්‍රී මහා බෝධියේ රාජකාරි සිදුකරන ගම්දුරයාගේ රාජකාරි කටයුතු සතුටු දායක මට්ටමක නොමැති නම් එය ගම්දුරයා ගම් පංගුකරුවන් වැඩි දෙනෙකුගේ කැමැත්ත මත බලයෙන් පහකර නව ගම්දුරයෙකු පත් කිරීමේ හැකියාවද පැවතුනි. විදානේ කෙනෙකු කැළයට ගොස් "බෝල්පනාතු" මිටියක් කපාගෙන විත් වැවේ කණුවක් සිටුවා බෝල බැන්ද විටදී එතැන් පටන් විදානේගේ අණ විධි විධාන පරිදි එම වැවේ මාලු ඇල්ලීම වහාම ක්‍රියාත්මක වන පරිදි නතර කළ යුතුය. විදානේවරුන් සතුව පැවති බලය පිළිබදව ප්‍රකාශ කෙරෙන කතා පුවතක් මෙසේ දැක්විය හැකිය.

> පුංචා නමැති මහදුර මහතා රාජකාරි කටයුතු කරන කාලයේදී ඔහු හා හල්මිල්ලකුලම පදිංචි ඔහුගේ ඥාතීන් එක්ව විහාර හල්මිල්ලකුලමේ පුරාණ මහවෙලේ කුණු ඇළවල් වල ගලන ජල පහර හරස් කොට අමුණක් තනා ඉන් කුඹුරු අක්කර 35ක පමණ කුඩා කුඹුරු යායක් අස්වැද්දීමට ආරම්භ කරගත් අතර එවකට විහාර හල්මිල්ලකුලමේ විදානේ ධුරය දරණ ලද්දේ කන්දාවිදානේ තැනය. ඔහු විසින් විහාරගම් සියල්ලට ප්‍රධානියා වුවද පුංචා මහදුර මහතාගේ සහ අනෙක් පිරිසගේ නව කුඹුරු ඉඩම් සඳහා වැව් ජලය සැපයීම කිසි දිනෙක සිදු නොකරන ලදි. එයට හේතුව වූයේ පුරාණ මහවෙලේ කුඹුරු ඉඩම් නාමලේඛනයේ අඩංගු නොවූ කිසිම කුඹුරකට ජලය නිකුත් නොකිරීමට කන්දා විදානේ තැන තදින්ම කටයුතු කළේය. දිනක් කන්දා විදානේගේ මූලිකත්වයෙන් පැවැත් වූ ගොවි හමුවකදී ගුණපාල නම් ගොවිගම වංශ පරම්පරාවට අයත් මුදලාලි කෙනෙකුට රහසිගතව තම කුඹුරක් උගස් තැබූ විහාර ගම්වාසී පුද්ගලයෙකු දැඩි දෝෂ දර්ශණයට ලක්කර රැස්වීම් භූමියෙන් පලවා හරින ලදි.

විහාර ගම්වාසී වෙල්ලිදුර වංශික බහුතර දෙනාගේ කැමැත්ත මත පත්වන විවිධ නිලධාරීන්ගේ බලය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කියාපාන විද්‍යාවේවරුන් හා සම්බන්ධ තවත් සිදුවීමක් මෙසේ සදහන් කල හැකිය.

> එක් දිනක් වස්තුවා නම් වෙල්විදානේ හට අයත් ගවයෙකු බන්ඩියා නම් මහදුර මහතාගේ කුඹුරකට හානි කර ඒ සදහා වස්තුවා වෙල්විදානේ විසින් අලාභය ගෙවීම පැහැර හැරීම නිසා වස්තුවා වෙල් විදානේ සතු ගවයා බන්ඩියා මහදුර විසින් ගම්සභාවට පමුණුවා එහි වෙන්දේසි කර එම අලාභය අයකර ගෙන ඇත.

(චන්ද්‍රපාල බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡාව, 2020.10.12).

### 3.3.4. ගම්වැසියන්

සාම්ප්‍රදායික විහාරගම් වැසියන්ගේ පරිපාලන ව්‍යුහයේ පහළම ස්ථරය වන්නේ ගම්වැසියන්ය. විහාර ගම්වැසියන් පාලනය වන්නේ ගම්දුරයා යටතේය. විහාර ගම් වැසියන් සියලු දෙනාම ගම්දුරයාගේ නිවසට පඩුරු ගෙන යාම සිදු කරති. ගම් වැසියන් වරිග සම්මතයට අනුව ක්‍රියා කළ යුතුය. ඔවුහු කිසියම් අවස්ථාවකදී වරිග සම්මතය කඩ කළහොත් එසේ සිදුකල ගම්වැසියා හෝ එම ගම්වැසියාගේ පවුලේ සියලු සාමාජිකයන් කුලයෙන් පහ කිරීමට වරිග සභාවට අයිතිය පැවතිනි. එසේ නියම කරන ඕනෑම දඬුවමකට එකග වීමට ගම්වැසියන් සියලුම දෙනා බැදී සිටියි.

ගම්වැසියන් සියලු දෙනා සියලු කාර්යයන් ගම්දුරයාගේ අනුමැතිය සහ අවවාද යටතේ සිදුකල යුතුය. ගම්වැසියන් අතර සිටින තේවාවන් සදහා සහභාගී නොවන පිරිමින් සියලු දෙනා කොණ්ඩය කොටට කැපිය යුතුය. එයට හේතුව වන්නේ මහදුරයා, ගම්දුරයන් සහ තේවාව සදහා සහභාගි වන ගම්වැසියන් කොණ්ඩය වවා තිබීමයි.ගම්වැසියන් විසින් ගම්දුරයාගේ නිවසේ ප්‍රදර්ශනය කරනු ලබන නම් ලැයිස්තුවෙන් තමන්ට රාජකාරි හිමි දිනය දැන ගත යුතුය.ගම්වැසියන් අතරින් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ රාජකාරි කටයුතු සදහා සුදුසුකම් ලබන ගම්වැසියන් තමන්ට රාජකාරි හිමි වන දිනයේදී අනිවාර්‍යයෙන්ම ඒ සදහා සහභාගී විය යුතුය.

ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට අයත් නින්දගම්වල ජීවත් වන හෙයින් වාර්ෂික අලුත් සහල් මංගල්‍යය, නානුමුර මංගල්‍යය වැනි උත්සව සදහා මහදුරයා ඇතුළු කපු මහත්වරුන්ට සහය දීමට ගම්වැසියන් බැදී සිටිති. තවද ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ අසල පවත්වන ශ්‍රමදාන ආදී කාර්යයන් මගහැරීම ගම්වැසියන්ට සිදුකල නොහැකිය. ගම්වැසියන් විසින් වර්ෂයක් අවසානයේදී තමන්ගේ වරිගයේ නායකයාගේ නිවසට පඩුරු ගෙන යාම සිදු කරනු ලැබීය.

### 3.4. වරිග සම්මතය

විහාර ගම්වාසී වෙල්ලිදුර වංශිකයන් ශ්‍රී මහා බෝධීන් වහන්සේට රාජකාරි කිරීම සදහා ඔවුන් විසින් සාදාගත් නීති රීති මාලාවක් සම්මත කර ඇත. එය වරිග සම්මතය නමින් හැදින්වෙයි.ඔවුන්ටම වෙන් වූ මෙම වරිග සම්මත නීති රීති රජයේ නීති පොත්පත් වල අඩංගු නොවුනද 1990 දශකයේ මහයා තනතුර හෙබවූ සිරිසේන මහදුර මහතාගේ ධූර කාලය අවසන් වන තුරුම මැනවින් හා තදින් ක්‍රියාත්මක විය. (ජයවර්ධන බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡා, 2020.10.10).

### 3.5. විවාහ චාරිත්‍ර

තවද ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා සම්බන්ධ රාජකාරි කටයුතු සදහා තෝරාගනු ලබන අමිශ්‍ර වෙල්ලිදුර වංශිකයන් විහාරගමක බිම්පංගුවක හිමිකාරයෙක් සහ විහාර ගමක පුරාණ මහ වෙලේ බිම් පංගුවක හිමිකාරයෙකු වීම අනිවාර්ය සුදුසුකමක් සේ සලකයි. විහාර ගම් වාසීන් අතීතයේ පටන් විවාහ ගනුදෙනු සිදුකරගත් මඩව-මැහිඇල්ල, පැලව-මැරුතලාව, පුරාණ වාහල්කඩ ආදී ගම්වල සිට පැමිණ විහාර ගමක සිය බිරිදගේ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

නිවසේ බින්න බැසගත් පසුවද ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ රාජකාරි සදහා සම්බන්ධ කර නොගනී. ඔවුන් විහාර ගම් වාසීන්ගේ පාරම්පරික ඥාතීන් වුවද උඩමළුවේ කිසිම රාජකාරි කටයුත්තක් සඳහා සම්බන්ධ කර නොගැනීම පුරාණ සිරිතය. ඔවුන් තම අමිශ්‍ර වෙල්ලිදුර පරපුරේ ලේ ඥාතීන් වුවද පුරුෂයන් "රටයා" ලෙසත් ස්ත්‍රීන් "රටී" ලෙසත් (රටයා මාමා, රටයා අයියා, රටී නැන්දා, රටී අක්කා ආදී ලෙස) වර්තමානය වන විටත් හඳුන්වනු ලබයි. මෙලෙස විවාහ වී බින්න බැසීමට පැමිණෙන්නන් අමිශ්‍ර වෙල්ලිදුර සාමාජිකයන් වුවද වරිග සම්මතයට එකගව සියලු කටයුතු කර තිබුණද ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ රාජකාරින් සදහා පිරිස තෝරාගැනීමේදී බාහිරින් ආ ඔවුන්ට අවස්ථාව නොදී වරිග සම්මතයට අනුව විහාර ගම් වාසී පාරම්පරික අමිශ්‍ර වෙල්ලිදුර ජනයාට පාරම්පරිකව හිමි වන විහාර ගම්හි ගම් පංගුවක් සහ විහාර ගම්හි පුරාණ මහ වෙලේ ගම් පංගුවක් තිබීම උඩමළුවේ රාජකාරියට මූලික සුදුසුකමකි. ඔවුන්ගේ ජනවහරේ එන කියමනක් වන "කුඩිපස්සේ ආපු උන් අතුහං කඩාගෙන ආපු උන් උඩමළුවේ රාජකාරි සදහා නොගන්නවා" යන්නෙන් ප්‍රකාශ කෙරෙන්නේ බාහිරින් වෙල්ලිදුර වංශික පරම්පරාව සමග එක් වන එවැනි පිරිසට ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ රාජකාරී තහනම් වන බවයි.

තවද එකල දරුවන් නොමැති අය අද මෙන් රෝහල් වලින් දරුවන් රැගෙන දරුකමට සාදාගන්නා ආකාරයක් නොවීය. යම් දරුවන් නොමැති පවුලක් වෙතොත් තම සහෝදරයාගේ හෝ සහෝදරියකගේ දරුවන් ඉල්ලා ගෙන දරුකමට සදාගැනීමට තහංචි නොවීය. අමිශ්‍ර වෙල්ලිදුර වංශික දරුවකු නොවන දරුවෙකු පිටස්තර පරිසරයෙන් ගෙන දරුකමට හදාගත්තේ නම් එම දරුවා නිරායාසයෙන්ම වරිග සම්මතයට අයත් නොවන අතර බාහිර අයෙකු සේ සලකයි.

1990 වර්ෂයට ආසන්නයේදී වරිග සම්මතයට පටහැනිව සිදුවූ විවාහයන් දෙකකදී සිරිසේන මහදුර මහතා විසින් තොයිල් තහනම මැනවින් හා දැඩිව ක්‍රියාත්මක කර ඇත. වරිග සම්මතය විහාර ගම්වාසී සියලු දෙනාටම පොදු කාරණාවක් බව ප්‍රකාශ වන කතාවක් විහාර ගම්වාසීන් සියලු දෙනා අතර ප්‍රචලිතව පවතී. එය කෙටියෙන් මෙසේ දැක්විය හැකිය.

> විහාර ගම් නවය අතරින් එකක් වන විහාර හල්මිල්ලකුලමේ ජීවත් වූ පුංචා මහදුර මහතාගේ පවුලේ දියණියක් වැඩිවියට පත්ව පැවැත් වූ මල්වර උත්සව අවස්ථාවකට පුංචා මහදුර මහතාගේ ඥාතිවරයෙක් වූ ජේම්ස් නැමැති තැනැත්තෙකු සහභාගි විය. ඉන් පෙර මෙම ජේම්ස් නැමැත්තා නුවර පැළව-මුරුතලාව ප්‍රදේශයෙන් විවාහ වී දුම්රියෙන් අනුරාධපුරයට පැමිණ අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට විහාරගම දක්වා සිය බිරිද සමග පැමිණෙන විට විහාරගම අසළ කුඹුරු ඉඩමක් හිමිව තිබූ තුරේරාජා නමැති දෙමළ ජාතිකයෙකු සමග කථා කරමින් පැමිණ ඇත. මෙයට උරණ වූ විහාර ගම්වාසී ඔහුගේ ඥාතීන් ඔහුව තරමක් කොන් කර තැබීය. එයට හේතුව වූයේ විවාහ මංගල ගමන් අවස්ථාවේදී දෙමළ ජාතිකයෙකු එයට සම්බන්ධ කර ගැනීමය. පුංචා මහදුර මහතාගේ නිවසේ පැවැත්වුන මල්වර උත්සවයට ජේම්ස් නැමැත්තාට ආරාධනා කර තිබූ හෙයින් ඔහුගේ පැමිණීම දුටු අන් අය වරිග සම්මතය උල්ලංඝනය කළ තැනැත්තෙකුට මල්වර උත්සව අවස්ථාවට ආරාධනා කිරීම සම්බන්ධයෙන් සහ ඔහුත් සමග එකට ආහාර ගැනීම වරිග සම්මතයට පටහැනි බැවින් පුංචා මහදුර මහතා තම රාජකාරී මණ්ඩලයේ ප්‍රධානියා වුවත් එයද නොසලකා හරිමින් ඔහුගේ නිවසේ පදිංචිකරුවන් හැර


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

අන් සියලු දෙනාම මල්වර උත්සව අවස්ථාව අතහැර විසිර ගියහ. එබැවින් ඉතිරි වූ විශාල ආහාර පාන සියල්ල හල්මිල්ලකුලම පුරාණ මහවෙලට ගෙනගොස් හලන ලදි.

(ජයවර්ධන බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡා, 2020.10.10).

### 3.6. ආර්ථික පසුබිම

මුල් කාලීනව ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ මළුවට ප්‍රවේශ වීමේදී අතීතයේ පැවත ඇත්තේ එක් ප්‍රධාන දොරටුවක් පමණි. එය නැගෙනහිර දොරටුවයි. චෝල, ද්‍රවිඩ ආදී සතුරු ආක්‍රමණ හමුවේ බෝධින් වහන්සේ රැකබලා ගැනීම උදෙසා බෝධි ආරක්ෂකයින් විසින් සතර දිශාවේම මුර කුටි සතරක් තනා රැකවල් ලා සිටි බව සඳහන් කරයි. අතීතයේදී බෝධින් වහන්සේ වැඳීමට හෝ භාරහාර වීමට පැමිණෙන බැතිමතුන් විසින් මෙම මුර කුටි වල සිටි බෝධි ආරක්ෂකයින්ට සුළු මුදලක් ලබා දී බෝධින් වහන්සේ අසලට යාමට අවස්ථාව උදාකරගෙන ඇත. එසේ විහාර ගම් වල පදිංචි බෝධි ආරක්ෂකයින් තම ජීවිතය පවත්වාගෙන යාමට එම මුදල ප්‍රයෝජනයට ගෙන ඇත.

බෝධින් වහන්සේ වැඳීමට පැමිණි පිරිස් විසින් බෝධින් වහන්සේට පඩුරු දැමීමක් සිදු කළ අතර බෝධි ආරක්ෂකයින් විසින් එම පඩුරු සියල්ල එකතු කොට එවකට තමාගේ වරිගයේ මහදුර තනතුර දරණ ලද පුද්ගලයාගේ නිවසට එම පඩුරු රැගෙන ගිය අතර එකල එම මුදල් වල අයිතිකරු ඔහු විය. බෝධින් වහන්සේට පඩුරු දැමීමද බෝධි ආරක්ෂක විහාර ගම් වැසියන්ගේ උපදෙස් මත සිදු කළ යුතුව තිබූ බවත් තවදුරටත් සඳහන් වේ. තවද ඔවුහු කෘෂිකාර්මික කටයුතු වලද නිරත වෙමින් ඔවුහු තම ජීවිකාව රැකගත්හ. එය කුඹුරු ගොවිතැන සහ හේන් ගොවිතැන වශයෙන් වර්ග කළ හැකිය. වෙල් විදානේ තනතුර දැරූ පුද්ගලයාගේ අභිමතය සහ මහ දුරයාගේ උපදෙස් පරිදි එම කටයුතු සිදු විය.

### 3.7. අධ්‍යාපනික පසුබිම

මුල් කාලීනව යමක් කමක් තිබූ වෙල්ලිදුර වංශික ප්‍රධානින්ගේ පවුල් වල පිරිස් පන්සල මගින් අධ්‍යාපනය ලැබූහ. සමාජය විසින් පිළිගනු ලබන අධ්‍යාපන මට්ටමකට උරුමකම් නොකියූවත් එකල විහාර ගම් වාසී ජනතාව තමන්ට පරම්පරාවෙන් උරුම වන ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ රාජකාරි සඳහා අවශ්‍ය වන දැනුමින් පරිපූර්ණ වූහ. එනම් ඔවුහු ඒ සඳහා අවශ්‍ය වන ගාථා, ශ්ලෝක, කවි, පිරිත් ආදිය කටපාඩමින් පරම්පරාවෙන් පරම්පරාවට උරුම කළහ. ඔවුන්ට පමණක් ආවේණික සංස්කෘතියට අයිති සියලු දෑ ඒ ඔස්සේ ඔවුහු ඉගෙන ගත්හ.

### 3.8. වෙල්ලිදුර වංශිකයන්ගේ බිඳවැටීම

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය වූ කාලවකවානුවේ පටන් සිරිසේන මහධුරයාගේ කාලවකවානුව දක්වාම නොනැසී ආරක්ෂා වූ වරිග සම්මතය ඉන්පසු පත් වූ මහයා වරිග සම්මතය ආරක්ෂා කිරීම අත්හැර දැමීම නිසාවෙන් අර්බුදයකට ලක් විය. මෙලෙස වරිග සම්මතය කඩකර පැහැර හැරි මහදුරයාගේ දුර්වල ක්‍රියාකලාපය අනුව යමින් පසුව පත් වූ මහදුරයන් දෙදෙනා විසින්ද වරිග සම්මතය ආරක්ෂා කිරීම පැහැර හැර ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ආර්ථික වාසි පමණක් සලසා ගැනීම නිසා දක්ෂිණ ශ්‍රී මහ බෝධීන් වහන්සේත් සමස්ථ වෙල්ලිදුර පරපුරත් විශාල අර්බුදයකට හා තර්ජනයකට ලක් කිරීමට කටයුතු කර ඇත. දැනට ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා සම්බන්ධව පවතින රාජකාරිමය ගැටලු හා විහාරගම් ආශ්‍රිතව පැන නැගී ඇති සියලුම ගැටලු වලට මූලිකම හේතුව වී ඇති බවට සැලකෙන්නේ වරිග සම්මතය ආරක්ෂා නොකිරීමය.පසුකාලීනව මහදුර තනතුරෙහි ඇති වූ අර්බුදකාරී තත්වයන් මත වර්තමානය වන විට මහදුර තනතුර සඳහා පුද්ගලයෙකු තෝරාපත්කිරීම

අටමස්ථානාධිපති හිමියන් සතුව පවතින කාර්යයභාරයක් බවට පත්ව ඇත. මෙහිදී අටමස්ථානාධිපති හිමියන්ගේ රුචිකත්වය මත මහදුර තනතුර තෝරාපත් කරගන්නා අතර වරිග සභාවෙහි හෝ ගම් දුරයන් නව දෙනාගේ කැමැත්ත විමසා බැලීම සිදුකරන්නේ නැත (ජයවර්ධන බෝධිදාස මහතා, සම්මුඛ සාකච්ඡා, 2020.10.10).

### 3.9. ශ්‍රී මහා බෝධිය වෙනුවෙන් වෙල්ලිදුර වංශිකයන්ගේ දෛනික රාජකාරීන්වල වර්තමාන තත්වය

මේ සම්බන්ධයෙන් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ සංඝාරාමය හෙවත් බෝ මළුව පන්සලේ ශාස්ත්‍රවේදී පහළ තලාවේ සුමනසිරි හිමියන් සමග පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවේ දී පැහැදිලි කලේ, ශ්‍රී මහා බෝධින් වහන්සේ උදෙසා අතීතයේ පටන් මේ දක්වා පවත්වාගෙන එනු ලබන දෛනික සහ වාර්ෂික පූජෝපහාර පිලිවෙළක් තිබේ. එදා මෙන්ම අදත් එම වතාවත් සඳහා වෙල්ලිදුර වංශිකයන් සහභාගී වෙති. අතීතයේදී මහදුරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුන මෙම පූජාවන් වර්තමානය වන විට පැවැත්වෙන්නේ ශ්‍රී මහා බෝධි විහාරාධිපති හෝ අටමස්ථානාධිපති හිමියන්ගේ ප්‍රධානත්වයෙනි. ජය ශ්‍රී මහ බෝධින් වහන්සේ උදෙසා දිනපතා සිදුකරනු ලබන තේවාවන් සඳහා වර්තමානයේදී සහභාගී වන පිරිස මෙසේය.

- භාරකාර ස්වාමින් වහන්සේගේ හෝ උන්වහන්සේගේ නියෝජිතයා
- බෝමළු පිරිසිදු කරන පිරිස
- විහාරගෙය පිරිසිදු කරන පිරිස
- සංඝාවාස පිරිසිදු කරන පිරිස
- බුද්ධ පූජාව පිළියෙළ කරන පිරිස
- මල් පහන් සූදානම් කරන පිරිස
- හේවිසි පූජා සහ දුරය පවත්වන පිරිස

ප්‍රථමයෙන්ම ශුද්ධ පවිත්‍ර කරන පිරිසද ස්වාමින් වහන්සේලාද එකතුව වැඩ ඉන්න මළුව, දෙවෙනි මළුව සහ තුන්වෙනි මළුවත් ඇමද පිරිසිදු කරති. වැඩ ඉන්න මළුව යනු ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩ සිටින මළුවයි. බෝධිය සප්‍රාණිකත්වයෙන් සැලකූ හෙයින් මෙම ව්‍යවහාරය ඇති වී තිබේ. එම ස්ථානයට විශේෂතම අමුත්තෙකුට හැර පොදුවේ සාමාන්‍ය පුද්ගලයන්ට යාමට අවසර නොමැත. එම වැඩ ඉන්න මළුව ඇමදීම අනිවාර්යයෙන්ම ස්වාමින් වහන්සේ නමක් විසින්ම සිදු කල යුතුය. එය එක්තරා සාම්ප්‍රදායික රටා ක්‍රමයකට අනුව කරනු ලබන ඇමදීමකි. එනම් සමචතුරස්‍රාකාර කොටු සිටින ආකාරයට එම ඇමදීම කල යුතුය. ඒ සඳහා මනා පුහුණුවක් ඇත්තෙකු එම කාර්යය සිදු කළ යුතු බැවින් එය දිනපතා ස්වාමින් වහන්සේ නමක් විසින් සිදු කරනු ලබයි (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).

මේ අතරතුර අනෙකුත් පිරිස සෙසු මළු ඇමදීම සිදු කළ යුතුය. ඉන් පසුව විහාරගෙය තුල ඇති පරමල් ඉවත්කර මලසුන් සහ විහාරගෙය පිරිසිදු කරනු ලබයි. පිරිසිදු කිරීමේ කටයුතු වලින් අනතුරුව බුද්ධ පූජාව හේවිසියෙන් වැඩමවාගෙන ඒම සිදු කරනු ලබයි. එයද භික්ෂූන් වහන්සේ නමකගෙ අතින්ම සිදුවෙයි. මෙලෙසින් නිල වශයෙන් දිනපතා පූජාව සිදුවෙයි. ඒ අනුව බෝධිය අබියස කෙරෙන පූජා පිළිවෙත තවදුරටත් මෙසේ දැක්විය හැකිය.

- වැඩ ඉන්න මළුව හා සෙසු මළු ඇමදීම
- මලසුන් හා විහාරගෙය ඇමද පිරිසිදු කිරීම
- බුද්ධ පූජාව හේවිසියෙන් වැඩම කිරීම
- පෙ.ව 11.00ට බුද්ධ පූජාව සඳහා දොරටු වැසීම
- ප.ව 02.00 ට යළි දොරටු විවෘත කිරීම
- නැවත ඇමදීම ඇතුළු වතාවත් (උදැසන සිදුකල ආකාරයටම)
- සවස ගිලන්පස පූජාව


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

➢ රාත්‍රි 09.00ට දොරටු වැසීම

➢ තේවා හේවිසි පැවැත්වීම

මේ සඳහා බෝමළුව පන්සලේ භික්ෂූන් වහන්සේලා සහභාගී වුවත් වර්තමානයේදී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස වන්දනාකරුවන්ගේ භාර වීම් සහ භාර ඔප්පු කිරීම් කටයුතු සියල්ල සිදු කරනු ලබන්නේ වෙල්ලිදුර වංශිකයන්ය. අතීතයේ සිදු කල පරිදිම 20 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් රාජකාරි සඳහා සහභාගී වේ. මහදුරයාගේ නිවසේ ප්‍රදර්ශනය කරනු ලබන නාම ලේඛනයට අනුව ඔවුහු ඒ සඳහා සහභාගී වෙති. එමෙන්ම මහදුර තනතුර දරන්නා විසින් වර්තමානයේදී පෙරවරු 11ට පවත්වන පූජාව සඳහා දිනපතා මල් වට්ටියක් පූජා කරනු ලබයි. එක් ගමකින් පැමිණෙන කණ්ඩායමක් වරු තුනක් රාජකාරි ඉටු කිරීමෙන් පසුව තවත් ගමකට රාජකාරිය භාර දෙනු ලබයි. ඒ ආකාරයට අඛණ්ඩව මෙම රාජකාරි කටයුතු පවත්වාගෙන යයි. තවද රාජකාරි කටයුතු සඳහා පැමිණෙන වෙල්ලිදුර වංශිකයන් වෙනුවෙන් ඔවුන්ට රැඳී සිටීම සඳහා වෙනම ගොඩනැගිල්ලක් බෝ මළුවේ පසෙකින් තනා ඇත (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).

### 3.9.1. තේවා හේවිසිය පැවැත්වීම

තේවා හේවිසිය යන්න දූරය යන වචනයෙන්ද හැඳින්වේ.

1) අලුයම් දූරය

2) මද්දහන් දූරය

3) හැන්දෑ දූරය

වශයෙන් මෙම තේවා හේවිසිය නිල වශයෙන් තුන් වාරයක් පැවැත්වේ. ප්‍රධාන විහාරය ඉදිරිපිට ඇති හේවිසි මණ්ඩපයේදී ශබ්ද පූජාව හෙවත් තේවා හේවිසිය පැවැත්වීම චිරාගත සම්ප්‍රදායයි. එය අදටත් එසේම සිදුවෙයි. වර්තමානයේදී දිනපතා ශ්‍රී මහා බෝධිය අසල පැවැත්වෙන හේවිසි තේවාව සඳහා සරිලන පිරිසක් විහාරගම් තුලින් සහභාගි කරවාගත හැකි වුවත් විශේෂ උත්සව අවස්ථා සඳහා හේවිසි වාදකයන් විශාල ප්‍රමාණයක් සොයාගැනීම අපහසුය. එයට හේතුව බවට පත්ව ඇත්තේ වර්තමානය වන විට එම පරම්පරාවල පුද්ගලයන් වෘත්තියක් වශයෙන් හේවිසි වාදනයේ නියැලීමට අකමැති වීමයි.

### 3.9.2. තේවා භාරකාරත්වය

අටමස්ථානයේ අධිපති බවට පත්වන භික්ෂූන් වහන්සේ මෙම සියලු තේවා පිළිබඳව කාර්යභාරය වෙනුවෙන් වගකිවයුත්තා වේ. විහාරගම්වල ගම් වැසියන් නියමිත රාජකාරිවල යෙදවීම, ඔවුන්ට උපදෙස් ලබා දීම හා පුදපූජා පිළිවෙත් නිසිලෙස සංවිධානය කිරීමද භාරකාර භික්ෂූන් වහන්සේ සතු වගකීමය.

### 3.9.3. මුර සේවය

වර්තමානයේදීද පෙර පරිදිම ගමකින් ගමකට වරු තුන බැගින් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස මුර සේවය සඳහා සහභාගී වෙති. එයද තීරණය කරනු ලබන්නේ ගම්දුර තනතුර දරන්නා විසින්. වර්තමානයේදී මුර සේවය සඳහා පැමිණෙන පුද්ගලයන් කොළ පාට සළුවක් පැළඳ සිටින නමුත් 'බෝධීන් වහන්සේගේ මුරකරු' යනුවෙන් සඳහන් ලාංඡනය නොපලඳියි. එමෙන්ම ඔවුහු දිවා රෑ බෝධීන් වහන්සේ අභියස මුර රාජකාරියෙහි යෙදෙති. වර්තමානයේදී ඔවුන් සතුන් පළවා හැරීම සඳහා කැට පෝල සහ රතිඤ්ඤා ආදිය යොදා ගනියි. එමෙන්ම වර්තමානයේදී බෝධීන් වහන්සේගේ ආරක්ෂාවට පොලිස් නිලධාරීන් සේවයෙහි යොදවා ඇත. සමස්ත උඩමළුව පූජා භූමිය පුරාවටම උඩමළුව පොලිස් ස්ථානයට අනියුක්තව සේවය කරන පොලිස් නිලධාරීන් 300ක් සේවයෙහි යොදවා ඇත (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

### 3.10. වර්තමානයේදී වාර්ෂික මංගල්‍යයන් ගේ වෙනස්වීම් සහ වෙල්ලිදුර වංශිකයන්ගේ දායකත්වය

වෙල්ලිදුර වංශිකයන් රැකගෙන ආ ප්‍රධාන මංගල්‍යයන් සතර වර්තමානයේදීත් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙනුවෙන් පැවැත් වේ. වර්තමානයේදී අටමස්ථානාධිපති නායක ස්වාමීන් වහන්සේගේ පූර්ණ අධීක්ෂණය යටතේ සහ අවවාද අනුශාසනා මත පුරාණ චාරිත්‍රානුකූලව මෙම සියලු මංගල්‍යයන් පැවැත්වේ. ඒ සඳහා අටමස්ථානාධිපති නායක ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ කොටගත් බෝමළුව පන්සලේ ස්වාමීන් වහන්සේලා සහභාගී වෙති. එහි ප්‍රධාන දායකත්වය දරනු ලබන්නේ වෙල්ලිදුර වංශිකයන්ය.

#### 3.10.1. දුරුතු මංගල්‍යය

දුරුතු පොහොය දිනයේදී පැවැත්වෙන අලුත් සහල් මංගල්‍යය වර්තමානයේදී යම් යම් වෙනස්කම් වලට භාජනය වී ඇත. මෙය අලුත් සහල් ප්‍රයෝජනයට ගෙන කරනු ලබන පූජාවකි. මෙම මංගල්‍යයේදී නියමිත නැකත් දිනට පෙර දින ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සමීපයෙහි සර්ව රාත්‍රික පිරිත් සජ්ජායනයක් පැවැත්වේ. එසේම අලුත් සහල් රැස් කරනු ලබන පිත්තල පාත්‍රාව වැලි මළුවේ පාවඩ මත, උඩුවියන් යට මහත් ගෞරවයෙන් තැන්පත් කෙරේ. සාමාන්‍ය දිනවලදී මෙම පාත්‍රා බෝධීන් වහන්සේගේ විහාර මන්දිරයේ තැන්පත් කර තිබේ. මෙම විශාල පාත්‍රාවක විශ්කම්භය අඩි තුනක් පමණ වන අතර උසද එපමණ වේ. පාත්‍රා තැන්පත් කිරීම අටමස්ථානාධිපති නායක හිමියන්ගේ අවවාද අනුශාසනා මත පෞරාණික වත් පිළිවෙත් නොපිරිහෙලා ඉටු කෙරෙමින් බෝමළුව පරම්පරාවේ භික්ෂූන් වහන්සේලා විසින් ඉටු කෙරෙයි. ඒ අවස්ථාවේදී ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට සාම්ප්‍රදායිකව රාජකාරි කරන ගඳව් කුලයේ අය ශබ්ද පූජාව පවත්වති (වික්‍රමගමගේ, චන්ද්‍රා; 2000). අලුයම එළඹෙන හෝරාවේදී බෝධීන් වහන්සේගේ සතර වාහල්කඩ කිරි ඉතිරවීම සිදු කෙරේ. ඒ සඳහා සැරසිලි කල නැවුම් මුට්ටි සහ අගිල් සඳුන් වැනි සුවඳ දර වර්ග ගනු ලබයි. ශබ්ද පූජාව මැද කිරි ඉතිරවීම සිදු කරනු ලබන්නේ පිරුවට ඇඳගත් වෙල්ලිදුර වංශික පිරිමි පක්ෂය විසිනි. එසේ පිළියෙළ කරගන්නා කිරි ආහාර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කෙරේ. ඉන්පසුව ආරම්භ කෙරෙන මහ පෙරහැරෙන් බෝධීන් වහන්සේ වෙත ගොවි ජනතාව පැමිණෙති. ඔවුහු උඩු වියන් යටින් රැගෙන එන සිය කෙත් වතු වල අග්‍ර කොටස මහත් ගෞරවයෙන් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කරති. තම කෙත්වතු සරු සාර වන්නේ උන්වහන්සේගේ පිහිටාධාරයෙන් බව ගැමියන්ගේ විශ්වාසයයි. එබැවින් දුරුතු මංගල්‍යය කෘතගුණ සැලකීමේ චාරිත්‍රයක් ලෙසද සැලකිය හැකිය.

දුරුතු පොහොය වන විට ඇතැම් අවස්ථාවලදී වර්ෂා කාලය අවසන් වී යාම නිසාවෙන් ගොයම් පැසී අවසාන නොවේ. එසේ වූ අවස්ථාවලදී කිරිබණ්ඩි කරල් එනම් නොපැසුණු වී කරල් ගෙන ඒවා මනා ලෙස තලා මිරිකාගත් ධාන්‍ය යුෂ කිරිබතට මිශ්‍රකර පූජාවට යොදාගනු ලැබේ. අලුත් සහල් මංගල්‍යය දිනයට පවත්වන රන් පාත්‍රයක බහාලූ කිරිහාර රැගෙන එන මෙම පෙරහැර මෑතක සිට සඳහිරු සෑය අසළ සිට ජය ශ්‍රී මහා බෝධිය දක්වා ගමන් කරයි. ඒ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ විසිරී සිටින අංකුර කලා කරුවන් රාශියක් සඳහාගී වන අතර එයට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුග්‍රහයද හිමි වේ. අතීතයේ සිටම රාජ්‍යය අනුග්‍රහයෙන් පැවැත්වෙන මෙම මංගල්‍යය වර්තමානයේදීද එලෙසින්ම රාජ්‍ය අනුග්‍රහයෙන් පැවැත්වෙන මංගල්‍යයකි.ගැමියෝ තමන් රැගෙන ආ අලුත් සහල් පාත්‍රයට දමන්නේ “ මෙම අලුත් සහලින් පාත්‍රය පිරී ඉතිරී යන්නා සේම රට භවබෝග සම්පතින් පිරී ඉතිරේවා” යන ප්‍රාර්ථනයෙනි. වර්තමානයේදී උතුරුමැද, නුවර කලාවිය ප්‍රදේශවලින් පිරිස් අනිවාර්යෙන්ම මෙම පූජාව සඳහා සහභාගී වෙති. මෙම මංගල්‍යයට


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

පැමිණෙන සැදැහැවතුන්ගේ සංඛ්‍යාවත්, කිරිහාර සඳහා එකතු වන අලුත් සහල් ප්‍රමාණයත් අනුව එම කන්නයේ සශ්‍රීක-නිශ්‍රීක භාවය මැන ගැනීමට හැකියාව ඇත. ඉන් අනතුරුව අටමස්ථාන නාහිමියන්ගේ මග පෙන්වීම මත රටේ කෘෂිකර්මය භාර අමාත්‍යවරයා ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට රිදී කාසි බන්දේසියක් පූජා කරයි. එය චිරාගත සම්ප්‍රදායක් ඉටු කිරීමකි. වර්තමානය වන විට මෙම මංගල්‍යය දුරුතු මසටම නොව නවම් හෝ මැදින් මාසවල්දී සිදු කරන බව පෙනෙයි. එයට හේතුව වන්නේ කාලානුරූපව සිදුවන වෙනස්වීම් නිසා රජරට අස්වනු නෙළන සමය මෙකී මාස වල සිදුවීමයි (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).

### 3.10.2. පරණ අවුරුදු මංගල්‍යය

අලුත් අවුරුද්දට සුබ පැතීමේ අරමුණින් අලුත් අවුරුද්දට දින කිහිපයට පෙර පැවැත්වෙන මෙම මංගල්‍යයද අතීතයේ පටන් අද දක්වා යම් යම් වෙනස්කම් වලට භාජනය වෙමින් අඛණ්ඩව පැමිණ ඇත. වර්තමානයේදී මෙම මංගල්‍යය සඳහා අදාළ නිලධාරීන් රැස්වී චාරිත්‍රානුකූලව දිනය නියම කරගනු ලැබේ. ඉන්පසුව විහාර ගම්වලට ඒ බව දන්වන ආඥාවක් නිකුත් කෙරේ. එම නියමයන් ලබාගැනීම සඳහා

- අටමස්ථාන නාහිමියෝ
- අටමස්ථාන පාලක සභාව
- විහාරයේ භික්ෂූන් වහන්සේලා

යන අය සහභාගී වෙති. මංගල්‍යයට පෙර දින සියලු දෙනා එක් වී එදින සවස ගිලන්පස, මල් පහන් සූදානම් කොට ඒවා ගෙන ගොස් බෝධිය අභියස පුදනු ලැබේ. එහිදී ගෙවී ගිය වසර තුළ එම ස්ථානයේ සිදු වූ සිදුවීම්, ප්‍රගතිය හා නව වසරේදී කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් ගැනද බෝධීන් වහන්සේට අධිගෘහිත කළුදේවතා බණ්ඩාර දෙවියන්ට දන්වා ඒ වැඩ ගැන දෙවියන්ගේ සහයෝගයත් බලයත් යොදවන ලෙස ඉල්ලමින් පුද පූජා පැවැත්වේ. පසුදා හිමිදිරි පාන්දර කිරි ආහාර පිළියෙළ කර රන් පාත්‍රයක බහා පෙරහැරෙන් වැඩමවා පූජාව පැවැත්වේ. මෙම සිරිත රුවන්වැලිසෑය අභියසදීද මෙම ආකාරයටම සිදු කරනු ලබයි. එම සිරිත පසුකාලීනව මෙම මංගල්‍යය සඳහා එක් වූවක් ලෙස සැලකේ. මෙහිදී පූජා කරන කිරිහාර, මුරුතැන්, මුළුතැන් යන නම් වලින්ද ව්‍යවහාර වේ. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට අධිගෘහිත කළුදේවතා බණ්ඩාර දෙවියන්ට දේව පූජාවක්ද පැවැත්වේ. අනතුරුව කඩවර දෙවියන්ට ගොටු පිදීම නම් චාරිත්‍රය ඉටු කෙරේ.

පරණ අවුරුදු මංගල්‍යය සඳහා සාමාන්‍යයෙන් ශ්‍රී මහා බෝධි විහාරයේ වැඩ වාසය කරන සියලුම භික්ෂූන් වහන්සේලා සහභාගී වෙති. වෙල්ලිදුර පරපුරේ පිරිසද ඒ සඳහා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතුය. එමෙන්ම ඔවුහු මංගල්‍යයට අවශ්‍ය භාණ්ඩ මෙන්ම සේවාවන්ද සැපයීම කළ යුතුය. වර්තමානයේදීද අලුත් අවුරුදු මංගල්‍ය පැවැත්වීමෙන් පසු පරණ අවුරුදු මංගල්‍යය පැවැත්වෙන තෙක් ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ භාරකාර ස්වාමීන් වහන්සේ කුමන හේතුවක් නිසාවත් අරුණක් ගත කිරීම සඳහා ශ්‍රී මහා බෝධි විහාරයෙන් පිටතට නොවඩිති.එය ඉපැරණි චාරිත්‍රයකි. ඒ අනුව පාංශුකූලයක්, මතක බණක් හෝ වෙනත් කුමන හෝ ආගමික කටයුත්තක් සඳහා හෝ පිටතට වැඩම කරවීම උන්වහන්සේ නොකරති (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).

### 3.10.3 නානුමුර මංගල්‍යය

අලුත් අවුරුදු මංගල්‍යය යන නමින්ද හඳුන්වන මෙම මංගල්‍යය වර්තමානය වන විට සුවිශේෂී වෙනස්කම් රාශියක් සමග පවැත්වේ. වර්තමානයේදී මෙම මංගල්‍යයට ජය ශ්‍රී මහා බෝධියත් රුවන්වැලිසෑයත් ඇතුළු අටමස්ථානයම සම්බන්ධ කරගනු ලබයි. මෙම මංගල්‍යයට බුද්ධ පූජා, බෝධි පූජා සහ දේව පූජාවක් ඇතුළත්ය.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සෙසු මංගල්‍යයන්ට වඩා මෙහි සුවිශේෂතා කිහිපයක් දක්නට ලැබෙයි.

- ➢ අටමස්ථානයේම භික්ෂූන් වහන්සේලා සහභාගී වීම
- ➢ බෝධියට ආභරණ පැළඳවීම
- ➢ අටමස්ථානාධිපති හිමියන් විශේෂ චාරිත්‍ර කිහිපයක් අනුගමනය කිරීම

මෙම මංගල්‍යයේදී අටමස්ථානාධිපති හිමියන් ප්‍රමුඛ අදාළ නිලධාරීන් රැස්ව දිනය නියමකර විහාර ගම් වලට ආඥාවක් නිකුත් කරනු ලැබෙයි. ඉන් පසුව රාජකාරි වලට බෙදා වෙන් කර ඇති වෙල්ලිදුර පිරිස පැමිණ පැවරී ඇති රාජකාරි කළ යුතුය. එම රාජකාරි අතර

- ➢ බෝධීන් වහන්සේගේ උතුරු දොරටුවේ සාම්ප්‍රදායික තොරණක් ඉදිකිරීම
- ➢ ගොක්කොළ සැරසිලි කිරීම
- ➢ පහන් අරම්බු බැඳීම
- ➢ පැරණි තොරණේ සිට විහාරය දක්වා පහන් වැටක් බැඳීම

ආදී රාජකාරි කටයුතු ප්‍රධාන වේ. නානුමුර මංගල්‍යයට පෙර දිනයේ සවස භික්ෂූන් වහන්සේලා සහ අදාළ නිලධාරීන්ද රැස්ව ඉහත දැක්වූ රාජකාරි කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ශ්‍රී මහා බෝධියට ආවේණික ආභරණ පැළඳවීමේ අති දුර්ලභ චාරිත්‍රය සිදු කරනු ලැබේ. පළමුව රන් වැට වටා සිවුරු එල්ලා බෝධීන් වහන්සේ ආවරණය කරනු ලබයි. අටමස්ථානාධිපති නාහිමියන් ප්‍රධාන පෙරහැරකින් වැඩසිටින මළුවට ආභරණ වැඩමවනු ලබයි. අනතුරුව වෙල්ලිදුර වංශිකයන් වැඩම වූ විශේෂිත පෙට්ටිවල තැන්පත් කර ඇති අති පෞරාණික රන් සළු සහ රිදී, මුතු, මැණික් සහිත ආභරණ බෝධීන් වහන්සේට පළඳවනු ලබයි. මෙම අතිදුර්ලභ චාරිත්‍රය සඳහා මහාවිහාරයේ බෝ මළුව පරම්පරාවට අයත් ස්වාමින් වහන්සේලා පමණක් සහභාගී වීම විශේෂත්වයකි. බෝධියේ කඳ රෙදිවලින් ඔතා ඒ මත ආභරණ පැළඳවීම සිදුකරයි. මෙම ආභරණ වසර දහස් ගණනකට පෙර රජවරුන් සහ අමාත්‍යවරුන් විසින් බෝධීන් වහන්සේට පිදූ පූජා භාණ්ඩ වේ. මේ සඳහා විවිධ ආභරණ ඇතත් වර්තමානයේදී යොදාගනු ලබන්නේ මාල, වළලු සහ පටි වර්ග පමණි. බෝධියට බර වැඩි නොවීම, තුවාල සිදු නොවීම හා එහි වයස ආදිය සලකා බලා මෙම ක්‍රමය අනුගමනය කරනු ලබයි. එකම මොහොතක දී එම පූජා සිදු කෙරෙයි. ඒ අතරතුර බෝ මළුව පරම්පරාවට අයත් ස්වාමින් වහන්සේලා කිහිපනමක් විසින් බෝ මළුව අමදිති. එම කාර්යය සිදුකරනු ලබන්නේ විශේෂිත රටාවක් අනුවය. එය පුරාණයේ සිට පැවත එන චාරිත්‍රයකි. ආභරණ පළඳා අවසානයේ අටමස්ථානාධිපති නාහිමියන් ඇතුළු බෝ මළුව පරම්පරාවේ භික්ෂුන් වහන්සේලා බෝධීන් වහන්සේට මල් පුදා පිරිත් සජ්ඣායනා කරති. සැන්දෑවේ පළඳවනු ලබන ආභරණ පසුදා පහන් වන තෙක් රාත්‍රිය පුරා තබනු ලබයි. මෙසේ බෝධීන් වහන්සේට රන් සළු සහ ආභරණ පැළඳවීමෙන් බෝධීන් වහන්සේ සක්විති රජෙකු සේ අභිෂේක කෙරෙන බව විද්වත් මතයයි. ඉන්පසුව කළු දේවතා බණ්ඩාර දෙවියන් ප්‍රධාන දෙවිවරුන්ට දේව පූජා පැවැත්වේ.

සන්ද්‍යා භාගයේදී උඩමළුව විහාරය කාර්යය බහුල වේ. භික්ෂුන් වහන්සේලාගේ උපදෙස් මත වෙල්ලිදුර වංශිකයන් මල්,පහන් සහිත පූජාව සකස් කරති. භික්ෂුන් වහන්සේලා සියතින්ම ගිලන්පස සූදානම් කිරීම මෙහි විශේෂත්වයකි. මල්,පහන්,ගිලන්පස සහිත භාජන නියමිත අනුපිළිවෙළකට අනුව පල්ලැක්කියේ තැන්පත් කරයි. එම කාර්යය සිදුකරන්නේ බෝ මළුව පරම්පරාවට අයත් ස්වාමින් වහන්සේ නමක් විසිනි. ගිලන්පස සහිත පෙරහැර ආරම්භ කිරීමට පළමුව බෝ මළුව පන්සලේ මිදුල කලා මංගල්‍යයක සිරි ගනී. අටමස්ථානාධිපති නාහිමි ප්‍රමුඛ කරගත් මහවිහාරයේ භික්ෂුන් වහන්සේලා එහි වැඩ හිඳිති. උන්වහන්සේලා ඉදිරිපිටදී විවිධ කලා ශිල්පීන් තම දස්කම් දක්වති. ඒ සඳහා සහභාගි වන කලාශිල්පීන් රට පුරා ප්‍රදේශ වලින් පැමිණෙන අතර ඔවුහු එය


*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

බෝධීන් වහන්සේට සිදු කරන ගෞරවයක් සේ සලකයි. අවසානයේදී ගිලන්පස සහ මල්, පහන් සහිත පල්ලැක්කිය රැගත් දර්ශණීය පෙරහැර වර්තමානයේදී නවීන සංවර්ධනයට උරුමකම් කියන පෙරහැර මාවතේ ගමන් කිරීම අරඹයි. ඉන්පසුව උතුරු දොරටුවෙන් වැලි මළුවට ඇතුළු වී බෝධීන් වහන්සේ පැදකුණු කරයි. යලි දේවාල මළුවේ උතුරු දොරටුවෙන් ඇතුල් වී බටහිර මල් ආසනය කරා පැමිණෙයි. අනතුරුව අටමස්ථානාධිපති නාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් සියලු පූජා භාණ්ඩ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කරති. මේ සඳහා වෙල්ලිදුර වංශිකයන්ද සහභාගී වේ. මෙම සියලු කාර්යයන් අවසන් වන තෙක්ම නොකඩවා හේවිසි සහ සණ්ඨාර නාද කල යුතුය. සියල්ල අවසානයේ අටමස්ථානාධිපති නාහිමියන් ප්‍රධාන විහාරගෙයට පිවිස මල් පුදා බුදුන් වඳිති. පසුදින හිමිදිරි පාන්දර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට නානුමුරය පැවැත්වේ. බෝ මළුව පරම්පරාවේ භික්ෂුන් වහන්සේලා වෙල්ලිදුර පරපුරේ ප්‍රධානින් සමග උඩු වියන් යටින් ප්‍රධාන විහාරගෙයට කෂාය, තෙල් බෙහෙත් සහිත නානුමුරය වැඩම කරති. භික්ෂුන් වහන්සේ විහාරගෙයට පිවිසීමත් සමග එහි සියලු දොරටු වසනු ලැබේ. භික්ෂුන් වහන්සේලා ප්‍රධාන බුදු පිළිම වහන්සේට නානුමුරය පවත්වති. විසා නැකතින් ශ්‍රී මහා බෝධි විහාරයේ ප්‍රතිමා වහන්සේට සොළොස් මහා පූජාව පැවැත්වේ. මෙම පූජා විධිය බුදුන් දිවමන් කල දෙවියන්ගේත්, අග්‍රෝපස්ථායක ආනන්ද හිමියන්ගේත් දෛනික පුද පූජා විධි සංකලනය කිරීමෙන් සකස් කර ඇති බව පාරම්පරික පිළිගැනීමයි.

නානුමුරය සඳහා වර්තමානයේදී භාවිතා කරනු ලබන්නේ ලංකාවේ අවුරුදු චාරිත්‍ර වල පවත්නා ඉසතෙල් ගෑමට සූදානම් කරන කෂාය වර්ග, තෙල් වර්ග හා ඇඹුල් වර්ග මිශ්‍ර කල යුෂයකි. විශාල කැඩපතකට ප්‍රධාන බුදු පිළිම වහන්සේගේ ඡායාව වැටෙන්නට සලස්වනු ලැබේ. එකී ප්‍රතිබිම්භය ආශ්‍රයෙන් බුදු පිළිමයේ සිරසේ නානු ගා නැවීම සිදු කෙරේ. ප්‍රථමයෙන් ආරාධිත ගාථාව සජ්ජායනා කරනු ලබයි.

''යාවතා භගවා ලෝකේ
තිට්ඨෙය්‍ය තව සාසනං
තාව ඨත්වාන ගණ්හාතු
පූජං ලෝකානුකම්පා''

'භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේගේ ශාසනය ලෝකයේ කොතෙක් කල් පවතීද, ඒ තාක් කල් ලෝකයාට අනුකම්පාව පිණිස මේ පූජා පිළිගන්නා සේක්වා.'' යනු එහි අර්ථයයි.

මෙම ආරාධනාවෙන් පසු සෑම ක්‍රියාවක්ම කිරීමට පෙර ගාථාවකින් එය විස්තර කිරීමේ අතීත චාරිත්‍රය අදටත් එලෙසින්ම පවතී. සුවඳ තෙල් සහ නානු ගැල්වීමෙන් අනතුරුව පැන් වත් කිරීම සිදු කෙරේ. එය අභිෂේකය යනුවෙන් හැඳින්වේ. බුදුන් වහන්සේගේ ශරීරයේ දිය පිසදමනු ලබන්නේ සුවඳ කවන ලද දුහුල් සළුවකිනි. අනතුරුව මුව දෙවීමට පැන් සහ දැහැටි පිළිගන්වනු ලබයි. ඉන් පසු ශ්‍රී හස්තයට පැන් වඩා ශ්‍රී පාදය දෝවනය කෙරේ. අනතුරුව කෙරෙන්නේ සිවුරු සහ හිඳ ගැනීම සඳහා ආසන පූජා කිරීමය. සිරිපතුල් වලට පැන් වඩා ශ්‍රී පාදය දෝවනය කරන්නේ ඊට පසුවය. සඳුන් මල්, සුවඳ දුම්, කපුරු, පහන්, පවන්, චාමර, ශබ්ද පූජාව සහිත ''දක්ඛිණෝදකය'' හෙවත් ශ්‍රී හස්තයට පැන් වැඩීම ඉන් අනතුරුව සිදු කෙරේ. පැන් පිළිගන්වා ව්‍යංජන සහිත දානය පිළිගැන්වේ. දානයෙන් පසුව යළි ශ්‍රී හස්තය දෝවනය කෙරේ. දැහැත් සහ මල් පූජාවක් සිදු කෙරේ. සියල්ලට පසුව පව් සමා කෙරේ. නානුමුර මංගල්‍යය අවසන් කෙරෙන්නේ පහත සඳහන් ගාථාව කීමෙනි.

''දේවෝ වස්සතු කාලේන
සබ්බ සම්පත්ති හේතුච
පීතෝ භවතු ලෝකෝච
රාජා භවතු ධම්මිකෝ''


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

කිසිම ගිහියෙකුට එම චාරිත්‍රය දැකගත නොහැකි වීමද විශේෂත්වයකි. නානුමුරය පැවැත්වෙන කාලය පුරා ශබ්ද පූජා පවත්වනු ලැබේ. නානුමුරය අවසානයේ සැදැහැවතුන් සදහා විහාරගෙයි දොරටු විවෘත කරනු ලැබේ. නානුමුරය අවසාන වීමත් සමගම මල්, පහන් සහ රන් පාත්‍රයේ කිරි ආහාර රැගත් පෙරහැර උඩමළුවට පිවිසේ. වර්තමානයේදී එහි මූලිකත්වය දරණු ලබන්නේද අටමස්ථානාධිපති නාහිමියන්ය. උන්වහන්සේ මල්, පහන් සමග රන් පාත්‍රයෙහි කිරි ආහාර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජා කරති. මෙම සියලු කාර්යයන් සිදුවන මුළු කාලය පුරාම මුර අවි රැගත් දොරටු පාලයෝ තුන්වෙනි මළුව මුර කරති. මේ පෙරහැරේ කොටසක් රුවන්වැලි මහ සෑය කරා ගමන් කරයි. එහි රැගෙන යන රන් පාත්‍රයේ කිරි ආහාර රුවන්වැලි මහ සෑයට පූජා කරනු ලබයි. වර්තමානයේදී කිරි ආහාර පූජා කරන විට එකම වේලාවක අටමස්ථානයේදීම එය සිදු කිරීම සුවිශේෂත්වයකි. එයින් නානුමුර මංගල්‍යය නිමා වේ (වික්‍රමගමගේ: 2000).

### 3.10.4. කාර්තික මංගල්‍යය

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙනුවෙන් සිදු කෙරෙන වසරේ අවසාන මංගල්‍යය මෙයයි. නොවැම්බර් මස පුර පොහොය දිනයේදී උදාවන කැති නැකතින් මෙය පැවැත්වේ. වර්තමානයේ දී ද මෙම මංගල්‍යය ඉතා සාර්ථක අයුරින් පැවැත්වේ. බෝධීන් වහන්සේට මල් පහන් සහිත ගිලන්පස පූජා කිරීම මෙහිදී සිදු කෙරේ. නානුමුර මංගල්‍යයේදී සේම කාර්තික මංගල්‍යයේදීද පසු දින බෝධීන් වහන්සේට සමගාමීව රුවන්වැලි මහා සෑයටද මල්,පහන්,ගිලන්පස සහ රන් පාත්‍රයේ කිරි ආහාර පූජා කිරීම සිදු කෙරේ. මෙම මංගල්‍යයේදී ඊළග වසරේ සිදු කිරීමට නියමිත වැඩ කටයුතු පිළිබඳව කළු දේවතා බණ්ඩාර දෙවියන් හට සැලකර සිටීම විශේෂත්වයකි. මෙය විෂ්ණු දෙවියන් වෙනුවෙන් සිදු කරනු ලබන පාරම්පරික පූජාවක් විය හැකි බවට මතයක් පවතී.

### 3.10.5. පැන් පෙරහැර

දැඩි නියග කාලවලදී සිදු කෙරෙන මෙම චාරිත්‍රය සුවිශේෂී මෙන්ම දුර්ලභ චාරිත්‍රයකි. වර්තමානයේදීද එය එලෙසින් සිදුවේ. රටට තද නියගයක් ආ විට පැන් පෙරහැර පැවැත්විය යුතු බවට රජය විසින් තීරණය කර ඇත. ඒ අනුව බෝ මළුව පරම්පරාවේ භික්ෂූන් වහන්සෙලාගේ ප්‍රධානත්වයෙන් තිසා වැවෙන් පැන් ලබා ගැනීම මෙහිදී සිදු කෙරෙයි. වෙල්ලිදුර වංශිකයන් ප්‍රධාන වශයෙන් මෙහි දායකත්වය උසුලන අතර වර්තමානයේදී අනුරාධපුර මහ දිසාපති, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම සේවක නිලධාරීන් ඇතුළු රාජ්‍ය නියෝජිතයින්ද මේ සදහා සහභාගී වෙති. එම පිරිස සහ සාමාන්‍ය ජනතාවද තිසා වැවෙන් පැන් කළ රැගෙන යති. ඉසුරුමුණිය විහාරයේදී පන්සිල් සමාදන්ව ඒ සමීපයේ ස්ථානයකින්ම තිසා වැවට බැස නැවුම් කළ ගෙඩි වලට ලබා ගන්නා පැන් උඩමළුවට ගෙන එන්නේ උඩු වියන් යටිනි. මෙම පෙරහැර සදහා ශබ්ද පූජා පැවැත්වීම වෙල්ලිදුර ඇත්තන්ගේ රාජකාරියකි. පැන් පෙරහැරේදී අවම වශයෙන් පැන් කළ එකසිය පණහකට නොඅඩු ප්‍රමාණයක් මෙසේ තිසා වැවෙන් ගෙන ඒම සාමාන්‍ය සිරිතකි.

මෙහිදී අටමස්ථානාධිපති හිමියන් ප්‍රධාන බෝමළුව පන්සලේ භික්ෂූන් වහන්සේලා පළමුව බෝධි පූජා පවත්වති. අනතුරුව ගෙන ආ පැන් වලින් බෝධීන් වහන්සේ දෝවනය කරති. ඉන් පසුව භික්ෂූන් වහන්සේලා විසින් වැසි පිරිත සහ සෙත් පිරිත් සජ්ඣායනා කරති. පැන් පෙරහැර පැවැත්වීමත් සමග නියගය නිමා වී වැසි ඇද හැලෙන බව ජනතාවගේ විශ්වාසයයි. එම චිරාගත විශ්වාසය පැන් පෙරහැර නමැති චාරිත්‍රයට හේතු වී ඇති බව පෙනෙයි. මෙම චාරිත්‍රය සදහා රට වෙනුවෙන් රජය සහ ජනතාව එකම බැදීමකින් යුක්තව ඒකරාශී වෙති (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

### 3.10.6. තල මල් පූජා කිරීම

වෙසක් පොහොය ළඟා වීමත් සමගම රජරට පුරා හේන්වල තල මල් පිපීම ආරම්භ වේ. වෙසක් පෙහොයට උඩමළුවට තල මල් රැගෙන ඒම පුරාණ සිරිතකි.

### 3.10.7. දරමිටි පෝය

අතීතයේ පටන් වන්දනාකරුවන් ඇසළ පොහොයට උඩමළුවට පැමිණියේ දර මිටියක් ද සමගිනි. එනිසා ඇසළ පෙහොය ප්‍රකට වූයේ දරමිටි පොහොය නමිනි. ගැමි ලියන් පමණක් දරමිටි ගෙන ඒම මෙහි විශේෂත්වයකි. වර්තමානයේදී ද නුවර කලාවියේ ඇතැම් ගැමියෝ ඇසළ පෝයට දර මිටියක් රැගෙන උඩමළුවට පැමිණෙති (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).

මෙම වාර්ෂික මංගල්‍යයන්ට අමතරව පොසොන් පොහොය මංගල්‍යය අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ කේන්ද්‍ර කරගනිමින් පැවැත්වෙන විශේෂ පුණ්‍ය මහෝත්සවයකි. රටේ සිව් දෙසින් සැදැහැවතුන් දස ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් පොසොන් පොහොයට උඩමළුව ප්‍රධාන අනුරාධපුරයට පැමිණෙති. ඊට අමතරව වසරේ පුරා පසළොස්වක පෝය දිනවල දී උඩමළුවේ විශේෂ ශීල ව්‍යාපාර ප්‍රධාන පිංකම් රැසක් උත්කර්ෂවත් ලෙස පැවැත්වීම සිරිතකි. වර්තමානය වන විට වාර්ෂික පිච්ච මල් පූජාව ආදී සැදැහැවතුන්ගේ විශේෂ පිංකම් රැසක් ද ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ කේන්ද්‍ර කරගනිමින් පැවැත්වෙනු දැකගත හැකිය.

ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ ලංකාවට වැඩම කර සියවස් 23කට පසුව අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගේ අංකුරයක් නැවතත් බුද්ධගයාවට වැඩම කළේය (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08). සාම්ප්‍රදායිකව සුදු වස්ත්‍රයෙන් සැරසී එහි චාරිත්‍ර සිදු කරනු ලබන්නේ වෙල්ලිදුර පරපුරේ අයෙකු විසිනි. ජය ශ්‍රී මහා බෝධින් වහන්සේගෙන් අංකුර හටගැනීම ඉතාමත් දුර්ලභ සිදුවීමකි. එම බෝධින් වහන්සේලා ලබා ගැනීමට දෙස් විදෙස් බෞද්ධයෝ නිරන්තරයෙන් ඉල්ලීම් සිදු කරති. ඒ අතරින් සුදුසු අයට බෝධින් වහන්සේගෙන් හටගන්නා බෝධි අංකුර පිරිනමන්නේ පුරාණයේ සිට පිළිගත් විධිමත් ක්‍රමවේදයක් අනුවය. චාරිත්‍ර පවත්වා අදාළ භික්ෂූන් වහන්සේට බෝධි අංකුරය භාර දෙනු ලබන්නේ අටමස්ථානාධිපති නා හිමියන් විසිනි (පහළතලාවේ සුමනසිරි හිමි, සම්මුඛ සාකච්ඡා, 2020.10. 08).

අටමස්ථානාධිපති හිමියන් වර්තමාන නිත්‍යානුකූල භාරකරු වශයෙන් ශ්‍රී මහා බෝධය සම්බන්ධයෙන් දිනපතා සියලු වතාවත් හා කටයුතු විමසා සොයා බලයි. එම කටයුතුවල දී බෝධීන් වහන්සේගේ තේවාවන් සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන දායකත්වය ලබා ගන්නේ වෙල්ලිදුර පරම්පාරවේ ඇත්තන්ගෙනි.

## 4. සමාලෝචනය

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ භාරව සිටින විහාර ගම් වල ජීවත් වන වෙල්ලිදුර වංශිකයන්ගේ අතිත සහ වර්තමාන සමාජ තත්වය පිළිබඳව අධ්‍යයනය කර ඇති මෙම පර්යේෂණය තුළින් මූලික වශයෙන් වෙල්ලිදුර වංශිකයන් සහ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අතර ඇති සම්බන්ධතාවයත් ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතය පිළිබඳවත් අධ්‍යයනය කර ඇත. වෙල්ලිදුර වංශිකයන් යනු ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලක්දිවට වැඩම කරවීමේදී එහි ආරක්ෂාව සඳහා පැමිණි කුමාරවරුන් අට දෙනා අතරින් ප්‍රධානියා වූ බෝධිගුප්ත කුමාරයාගෙන් පැවත එන පිරිසකි. අනුරාධපුර මහමෙව්නාවේ ජය ශ්‍රී මහා බෝධින් වහන්සේ රෝපණය කළ දිනයේ පටන් අද වන තෙක්ම උන්වහන්සේගේ ආරක්ෂාව මෙන්ම පුද පූජා, තේවාවන් ආදී සියලු රාජකාරීන් සඳහා ප්‍රධාන වශයෙන් දායකත්වය සපයනු ලබන්නේ වෙල්ලිදුර වංශිකයන්ය.ශ්‍රී මහා බෝධිය භාරව සිටින විහාර ගම් වල ජීවත්වන ජනතාව ශ්‍රී

මහා බෝධිය රැකබලා ගැනිමටත් එයට තේවාවන් පැවැත් වීමටත් කැපකිරීම් රාශියක් සිදු කරයි. එදා පටන් අද දක්වා ඔවුන් ඔවුන්ට පැවරුණ රාජකාරිය ඉටු කිරීමේදී සමාජ වෙනස් වීම් වලට මුහුණ දීමට සිදුවුවත් එම කාර්යය නොකඩවා සිදු කරන බව පෙනී යයි. වර්තමානය වන විට විහාර ගම් වාසී වෙල්ලිදුර වංශිකයන්ගේ සමාජ තත්වයෙහි වෙනස්කම් රාශියක් දක්නට ලැබෙයි. එනමුත් බෞද්ධයන්ගේ නිරන්තර වන්දනීයත්වයත්වයට පත් වූ ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සියවස් විසි තුනක් පුරාවටම නිරුපද්‍රිතව වැඩ වාසය කරන්නේ වෙල්ලිදුර වංශිකයන්ගේ ඉමහත් කැප කිරීම් මතය. එබැවින් ඔවුහු අගය කළ යුතුය.

## ආශ්‍රිත මූලාශ්‍රය


- උයන්ගොඩ, ජයදේව, (2010), සමාජීය - මානවීය විද්‍යා පර්යේෂණ, සමාජ විද්‍යා සංගමය, කොළඹ.
- කරුණානන්ද, උක්කුබණ්ඩා, (2007), අනුරාධපුර අටමස්ථානය, උරුමය අධ්‍යයන ආයතනය, පොල්ගස්ඕවිට.
- චන්ද්‍රසේකර, කඳන්ගමුවේ, (2022) ජය ශ්‍රී මහා බෝධිවංසය, මහාවිහාරය, අනුරාධපුරය.
- තෙන්නකෝන්, ආර්. (1964) සිංහල බෝධිවංසයය, ශ්‍රී ලංකා ප්‍රකාශන සංගමය, කොළඹ.
- ගම්ලත්, සුචරිත, (2019), කාව්‍යශේඛරය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.
- දිසානායක ජේ. බී, (2002), ජය ශ්‍රී මහාබෝධිය, එස්.ගොඩගේ සමාගම, කොළඹ.
- දිසානායක ජේ. බී, (2002), 'ජය ශ්‍රී මහා බෝ සමිඳුන් හා බැඳුනු සිරිත් විරිත් හා පූජෝත්සව', ජය ශ්‍රී මහා බෝ වරුණ, එස්.ගොඩගේ සමාගම, කොළඹ.
- ධම්මරක්ඛිත හිමි, වැලමිටියාවේ, (2000), ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා තදානුබද්ධ සංස්කෘතිය, දෙහිවල.
- නානායක්කාර, සනත්, (1998), බුදු දහම හා ශ්‍රී ලංකාවේ සෙසු ආගම්, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.
- වාව්වගේ, සුමනසිරි, (2022) ජය ශ්‍රී මහා බෝධිවංසය, මහාවිහාරය, අනුරාධපුරය.
- සිරිනිවාස හිමි, පල්ලේගම, (2007), ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ ප්‍රමුඛ අටමස්ථානයේ භාරකාරත්වය, පරිපාලනය සහ පාරම්පරික සේවා දායකත්වය, රන්වැට අරමුදල, කොළඹ.
- සේනාධීර, ගුණපාල, (1970), සිංහළ බෝධි වංසය, කොළඹ.
- ස්වර්ණසිංහ, කේ. එම්. අයි., (2002), අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය, චාග ප්‍රකාශන, පන්නිපිටිය.
- ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ, දේවරක්ෂිත බටුවන්තුඩාවේ, (1996), මහාවංශය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ.
- වික්‍රමගමගේ, චන්ද්‍රා, (2000), අනුරාධපුර පූජනීය හා රාජකීයස්ථාන, මහරගම.
- Rao, C. N. S (1990). **Sociology**, New Delhi: Oxford University Press.


**සම්මුඛ සාකච්ඡා**

- සුමනසිරි හිමි, පහළතලාවේ, 2020.10.08, ශ්‍රී මහා බෝධිය වෙනුවෙන් වෙල්ලිදුර වංශිකයන්ගේ දෛනික රාජකාරිවල වර්තමාන තත්වය.
- බෝධිදාස, ජයවර්ධන, 2020.10.10, වෙල්ලිදුර වංශිකයන් බෝධි ආරක්ෂාව වෙනුවෙන් දිනපතා සිදු කළ කාර්යයන් සහ වතාවත්.
- බෝධිදාස, චන්ද්‍රපාල, 2020.10.12, වෙල්ලිදුර වංශිකයන් ශ්‍රී මහා බෝධියේ කටයුතු කිරීමේ දී සකසා ගත් පරිපාලන ව්‍යුහය.


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk